වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2021

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

වැය ශීර්ෂ අංකය 010

අන්තර්ගතය

පළමුවන පරිච්ඡේදය ---------- 05

1. ආයතනයේ පැතිකඩ ---------- 06

1.1. හැඳින්වීම ---------- 06

1.2. ආයතනයේ දැක්ම හා මෙහෙවර ---------- 06

1.3. කාර්යභාරය ---------- 06

1.4. ආයතනයේ සංයුතිය ---------- 07

1.5. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන අංශ -- 08

දෙවන පරිච්ඡේදය ---------- 13

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම ---------- 14

2.1. ආයතනයේ ප්‍රගතිය ---------- 14

2.1.1. පැමිණිලි ලැබීම් ---------- 14

2.1.2. වැටලීම් ---------- 15

2.1.3. විමර්ශන කටයුතු ---------- 17

2.1.4. නඩු පැවරීම් ---------- 18

2.1.5. නඩු අවසන් කිරීම් ---------- 20

2.1.6. විභාග වෙමින් පවතින නඩු ---------- 20

2.1.7. විත්තිකරුවන් වරදකරුවන් කිරීම් ---------- 20

2.1.8. පවත්වන ලද දූෂණ නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ---------- 21

2.2. අභියෝග ---------- 25

2.3. ඉදිරි ඉලක්ක ---------- 26

තෙවන පරිච්ඡේදය ---------- 27

3. වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය ---------- 28

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ---------- 28

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ---------- 29

3.3. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය ---------- 30

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් ---------- 31

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය ---------- 43

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය ---------- 47

3.7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන ---------- 48

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ---------- 49

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව ---------- 51

සිව්වන පරිච්ඡේදය ---------- 61

4. කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)---------- 62

පස්වන පරිච්ඡේදය ---------- 63

5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය ---------- 64

5.1. හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු ---------- 64

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග ---------- 65

හයවන පරිච්ඡේදය ---------- 67

6. මානව සම්පත් පැතිකඩ ---------- 68

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය ---------- 68

6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආකාරය ---------- 68

6.3. මානව සම්පත් සංවර්ධනය ---------- 69

හත්වන පරිච්ඡේදය ---------- 73

7. අනුකූලතා වාර්තා ---------- 74

පළමුවන පරිච්ඡේදය

1. **ආයතනික පැතිකඩ**

    1.1. හැඳින්වීම

    1.2. ආයතනයේ දැක්ම හා මෙහෙවර

    1.3. කාර්යභාරය

    1.4. ආයතනයේ සංයුතිය

    1.5. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන අංශ

1. ආයතනයේ පැතිකඩ

1.1. හැඳින්වීම

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව (CIABOC) 1994 අංක 19 දරන පනත යටතේ පිහිට වූ අතර එය 1994 දෙසැම්බර් මස 15 වන දින සිට ක්‍රියාත්මක වන්නේය. වර්තමානයේදී මෙම කොමිෂන් සභාව, අල්ලස හෝ දූෂණය මැඩලීම සඳහා වන ස්වාධීන ව්‍යවස්ථාමය ආයතනය ලෙස කටයුතු කරයි.



1.2. ආයතනයේ දැක්ම හා මෙහෙවර

1.2.1. දැක්ම

අල්ලස හා දූෂණයෙන් තොර ශ්‍රී ලංකාවක් බිහි කිරීම

1.2.2. මෙහෙවර

අල්ලස, දූෂණය හා නීති විරෝධී වත්කම් ඉපයීම සම්බන්ධයෙන් අපක්ෂපාති හා සාධාරණ විමර්ශනයක් සිදුකර අධිකරණ ක්‍රියාදාමයන් ක්‍රියාත්මක කිරීම තුලින් හා අල්ලස හා දූෂණයට එරෙහි වීම පිළිබඳව සමාජයේ සියළු ජන කොටස් වල දැනුවත් භාවය ඉහල නැංවීම තුලින් ශ්‍රී ලංකාවේ අල්ලස හා දූෂණය අවම කිරීමට කටයුතු කිරීම.

1.3. කාර්යභාරය

- අල්ලස් / දූෂණ චෝදනා / අයුතු වත්කම් ඉපයීම පිළිබඳව පැමිණිලි ලබාගැනීම
- පැමිණිලි සඳහා අපක්ෂපාතී හා සාධාරණ විමර්ශන සිදු කිරීම
- නඩු පැවරීමට ප්‍රමාණවත් කරුණු අනාවරණය වන පැමිණිලි සඳහා නියමිත අධිකරණයන්හි නඩු පැවරීම හා එම නඩු අධිකරණ වල මෙහෙයවීම

- විමර්ශන කටයුතු / නඩු කටයුතු අවසන් වූ පසු අදාල පාර්ශවයන්ට ඒ පිළිබඳ තොරතුරු ලබාදීම
- අල්ලසට හා දූෂණයට එරෙහිවීම පිළිබඳව සමාජයේ සියළු ජන කොටස් වල දැනුවත්භාවය ඉහළ නැංවීම
- එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී සම්මුතිය (UNCAC) ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක කරවීම

1.4. ආයතනයේ සංයුතිය



1.5. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව යටතේ ක්‍රියාත්මක වන අංශ

1.5.1. කොමිෂන් සභාව

1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2 (ආ) වගන්තිය ප්‍රකාරව හා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ මත අතිගරු ජනාධිපතිතුමා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් වර්ෂ පහක ධුර කාලයක් සඳහා පත් කරනු ලබයි.

කොමිෂන් සභාව සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, ඉන් දෙදෙනෙක් ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමලත් විනිසුරුවරුන් විය යුතුය. කොමිෂන් සභාවේ හතරවන සාමාජිකයා අපරාධ විමර්ශනය හා නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව පුළුල් පළපුරුද්දක් සහිත විශ්‍රාමලත් නිලධාරියෙකු විය යුතුය. කොමිෂන් සභාවේ සභාපති ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමලත් විනිසුරුවරුන්ගෙන් එක් අයෙකු ජනාධිපතිතුමන් විසින් පත් කරනු ලබයි.

ඒ අනුව 2020 දෙසැම්බර් මස 07 වන දින සිට පහත නම් සඳහන් සාමාජික/සාමාජිකාවන් ගෙන් සැදුම්ලත් කොමිෂන් සභාවක් පත් කරන ලදී.

- විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ඊවා වනසුන්දර මහත්මිය - සභාපතිනි
- විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරු දීපාලි විජේසුන්දර මහත්මිය - සාමාජික
- විශ්‍රාමලත් නියෝජ්‍ය පොලිස්පති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතා - සාමාජික

1.5.2. අධ්‍යක්ෂ ජනරාල්

1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටුකිරීමට හා කොමිෂන් සභාවට සහාය වීමට ජනාධිපතිවරයා විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා වැළැක්වීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත් කරනු ලබයි. 2020.01.30 දින සිට මහාධිකරණ විනිසුරු ඩබ්.කේ.ඩී. විජේරත්න මහතා මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කරනු ලබයි.

1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 11 වන වගන්තිය ප්‍රකාරව අල්ලස් පනතේ **II** වන කොටස යටතේ වරදක් හෙළිදරව් වන්නා වූ ද, වටිනාකම රුපියල් 2000/- ක් නොඉක්මවන තුටු පඬුරක් අයදීම, භාර ගැනීම හෝ පිරිනැමීම පිළිබඳ තොරතුරු හෙළිදරව් වන අවස්ථාවක මහේස්ත්‍රාත් අධිකරණයේ දී ද, රුපියල් 2000/- කට වැඩි වටිනාකමකින් යුත් තුටු පඬුරක් අයැදීම, භාර ගැනීම හෝ පිරිනැමීම පිළිබඳ කරුණු හෙළිදරව් වන්නේ නම් මහාධිකරණයක නඩු පැවරීම සඳහා කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට විධානය කරනු ලබයි. කොමිෂන් සභාවේ විධානය පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්සන් තබන ලද අධි චෝදනා පත්‍රයක් යටතේ මහාධිකරණයේ නඩු පවරන ලද අවස්ථාවක එම අධිචෝදනා පත්‍රය නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද අධිචෝදනා පත්‍රයක් මෙන් එය විභාග කිරීම සඳහා මහාධිකරණයට බලය ඇත්තේය.

අල්ලස් වලින් අත් කර ගත් දේපළ හෝ අල්ලස් වලින් අත් කර ගත් දේපළකින් පරිවර්තනය කර ඇති හෝ කර තිබූ දේපළ සම්බන්ධයෙන් අල්ලස් පනතේ 23 **'අ'** වගන්තිය යටතේ වන වත්කම් අත්පත් කර ගැනීම පිළිබඳ අවස්ථාවක දී (අල්ලස් පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව) මහාධිකරණයේ අධි චෝදනා පත්‍රයක් ගොනු කිරීම මගින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නඩු පවරනු ලැබිය යුතුය.

අල්ලස් පනතේ 70 වන වගන්තිය ප්‍රකාරව දූෂණ වරදක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ නඩු පවරනු ලැබිය යුතුය. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 849/15 සහ 1994.12.15 දින දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව අල්ලස් පනතේ **II** වන කොටසේ තුටු පඬුරක් පිරිනැමීම, අයැදීම, භාර ගැනීම යන වැරදි සම්බන්ධයෙන් ද අල්ලස් පනතේ **V** වන කොටසේ සියලු වැරදි සම්බන්ධයෙන්ද කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ සහ මහාධිකරණයේ දී අවස්ථානුකූලව නඩු පැවරීමේ බලය අධ්‍යක්ෂ ජනරාල්වරයාට හිමි වනු ඇත. තවද ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ කරන ලද වැරදි සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ උපදෙස් මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරනු ලැබිය යුතුය.

ඉහත සඳහන් වගකීම් වලට අමතරව අල්ලස හා දූෂණය වැළැක්වීම පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා කොමිෂන් සභාවේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ලෙස පරිපාලන කටයුතු පිළිබඳව වගකිව යුතුය. මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට සෙසු නිලධාරීන්ගේ සහාය ලැබේ.

1.5.3. නීති අංශය

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 16 වන වගන්තිය ප්‍රකාරව පත් කරනු ලබන අධ්‍යක්ෂ ජනරාල්වරයා නීති අංශයේ ප්‍රධානියා වශයෙන් ද කටයුතු කරයි.

අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහාය වීම සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරු 05 දෙනෙකු ද, සහකාර අධ්‍යක්ෂ ජනරාල්වරු 07 දෙනෙකු ද, සහකාර අධ්‍යක්ෂ (නීති) නිලධාරීන් 14 දෙනෙකු ද, නීති අංශයට අනුයුක්තව කටයුතු කරයි.

ස්වාධීන නීති අංශයක් කොමිෂන් සභාව සතු වන අතර එකී අංශය විසින් සාක්ෂි ඇගයීම, චෝදනා හා අධිචෝදනා පත්‍ර සැකසීම සිදු කරනු ලබයි. තවද කොමිෂන් සභාව වෙනුවෙන් පැමිණිල්ලේ නඩු මෙහෙයවීම නීති අංශයේ නිලධාරීන් විසින් සිදු කරනු ලබයි.

1.5.4. විමර්ශන අංශය

අල්ලස් හෝ දූෂණ චෝදනා පිළිබඳ සියලු විමර්ශන කටයුතු සිදුකරනු ලබන්නේ මෙම කොමිෂන් සභාවේ ස්ථාපනය කර ඇති විමර්ශන අංශය මගිනි.

1954 අංක 11 දරන අල්ලස් පනතෙන් හා 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතෙන් පවරා දී ඇති බලතල අනුව විමර්ශන අංශයට නිලධාරීන් පත්කොට ඇත.

විමර්ශන අංශයේ අධ්‍යක්ෂ ලෙස කාන්තා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි පද්මිණි වීරසූරිය මහත්මිය 2021 ජුනි මස 18 වන දින දක්වා රාජකාරි ඉටු කර ඇති අතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඒ.ජී. නුවන් අසංග මහතා 2021 ජුනි මස 23 වන දින සිට රාජකාරි ඉටු කරනු ලබයි.

මෙම විමර්ශන අංශය ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවෙන් ද්විතීයන පදනමෙන් පත් කර ගත් පොලිස් නිලධාරීන් 214 දෙනෙකුගෙන් සමන්විත වේ.

1.5.5. ලේකම් අංශය

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ලැබෙන සියලු පැමිණිලි ලියාපදිංචි කර සුදුසු නියෝග ලබා ගැනීම සඳහා, කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ලේකම් අංශය විසින් සිදු කරනු ලබයි. මෙම අංශයේ ප්‍රධානියා ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිනියක් වූ ආර්.එම්.වී.ශාන්ති ජයසේකර මහත්මිය 2017 අප්‍රේල් මස සිට 2021 පෙබරවාරි මාසය දක්වාද, එම ශ්‍රේණියේම නිලධාරිනියක් වූ ඩබ්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න මහත්මිය 2021 පෙබරවාරි මස සිට අප්‍රේල් 05 දින දක්වා රාජකාරි ඉටු කර ඇත. එසේම 2021 අප්‍රේල් 06 දින සිට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිනියක් වන අජ්සරා කල්දේරා මහත්මිය කොමිෂන් සභා ලේකම් ලෙස කටයුතු කරනු ලබයි.

1.5.6. පාලන අංශය

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පරිපාලන කටයුතු, අධ්‍යක්ෂ (පාලන) යටතේ සිදුකරනු ලබයි. අධ්‍යක්ෂ (පාලන) වශයෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු වන පන්තියේ නිලධාරියෙකු වන ඒ.එම්.ආර්.එස්.ඒ.අදිකාරි මහතා 2014 වර්ෂයේ සිට කටයුතු කරයි. මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාරයන් පහත පරිදි වේ.

- ආයතනයේ පිරිස් කළමනාකරණ කටයුතු
- මානව සම්පත් සංවර්ධන කටයුතු
- ප්‍රවාහන අංශය කළමනාකරණ කටයුතු
- ගොඩනැගිලි හා කාර්යාල පරිශ්‍රය නඩත්තු කර පවත්වා ගැනීමේ කටයුතු

1.5.7. මුදල් අංශය

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මූල්‍ය කළමනාකරණ කටයුතු සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා දායක වන මෙම අංශය ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ පළමු පන්තියේ ගණකාධිකාරීවරයෙකු වන ඩබ්.එම්.ඩී.බණ්ඩාර මහතාගේ මෙහෙයවීම යටතේ හා ගණකාධිකාරි (ප්‍රසම්පාදන) ජී.එන්.ජයසිංහ මහත්මියගේ හා කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ සහාය සහිතව ක්‍රියාත්මක වේ. මූල්‍ය කළමනාකරණය, ගිණුම් වාර්තා සකස් කිරීම ඇතුළු පහත සඳහන් කටයුතු මෙම අංශයේ කාර්ය භාරය වේ.

- විමර්ශන අංශයේ හැර කොමිෂන් සභාවේ සියලුම නිලධාරීන්ගේ වැටුප් ගෙවීම ඇතුළු සියලු ආකාරයේ ගෙවීම්.
- ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කිරීම.

- විශේෂ අත්තිකාරම්, උත්සව අත්තිකාරම්, ආපදා ණය ගෙවීම් සිදු කිරීම සඳහා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන යාම.

- වැටලීම් වලදී උපාය දූතයන් ලෙස ඊට සම්බන්ධ වන නිලධාරීන්ට අත්තිකාරම් ලබාදීමට වැටලීම් අත්තිකාරම් ගිණුම් පවත්වා ගෙන යාම.

1.5.8. අභ්‍යන්තර විගණන අංශය

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණින් 2018 නොවැම්බර් මාසයේදී අභ්‍යන්තර විගණන අංශය ස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ II ශ්‍රේණියේ නිලධාරිණියක වන යූ.පී. විජේහේවා මහත්මියගේ මග පෙන්වීම යටතේ එම අංශයේ කටයුතු සිදු කරනු ලබයි. අභ්‍යන්තර විගණන අංශය විසින් ආයතනයේ ගිණුම් කටයුතු භාවයේ නිවරදතාවය සහ මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය සහ අනෙකුත් චක්‍රලේඛයන්ට අනුකූලව කටයුතු සිදුවන බව තහවුරු කිරීමටත්, විනිවිද භාවය ආරක්ෂා කිරීමටත් ක්‍රියා කරනු ලබයි.

තවද, කළමනාකරණ සහ විගණන කමිටු රැස්වීම් පැවැත්වීම මගින් අභ්‍යන්තර විගණනය සහ විගණකාධිපති විසින් විටින් විට ලබා දෙන නිරීක්ෂණ වලට නිසි කලට ප්‍රතිචාර දැක්වීමටත්, අවධානය අවශ්‍ය කටයුතු වලට අදාලව ඒ ඒ අංශ වල වගකිවයුතු නිලධාරීන්ට වගකීම පැවරීමත්, ඒවා පසු විපරම් කිරීමත්, විධිමත්ව සිදු කරනු ඇත.

1.5.9. සැලසුම් අංශය

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරන ක්‍රියාකාරකම් වැඩිදුරටත් සාර්ථකව ඉටුකිරීම සඳහා 2018 නොවැම්බර් මාසයේ සිට සැලසුම් අංශය ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II ශ්‍රේණියේ නිලධාරියෙකු වන එස්.ඒ.සී.එන්. ජයතිලක මහතාගේ මෙහෙයවීම යටතේ මෙම අංශය ක්‍රියාත්මක වේ. ආයතනයේ එක් එක් අංශ විසින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් වල ප්‍රගතිය ඇතුලත් වාර්තා සකස් කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාරය වේ. ඊට අමතරව පහත සඳහන් කාර්යයන් ද ඉටු කරයි.

- මාසික ප්‍රගති වාර්තා සකස් කිරීම
- ප්‍රගති වාර්තා කාර්තුමය වශයෙන් සකස් කිරීම
- අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කිරීම සඳහා ප්‍රගති වාර්තා සකස් කිරීම
- වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කිරීම
- වාර්ෂික ක්‍රියාකාරි සැලස්ම සකස් කිරීම
- වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුව කටයුතු සිදුවේදැයි පසු විපරම් කිරීම
- තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තා සකස් කිරීම
- අල්ලස හා දූෂණය මැඩලීමේ පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලස්ම ක්‍රියාත්මක කිරීමේ කටයුතු සම්බන්ධීකරණය

දෙවන පරිච්ඡේදය

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

(විශේෂ ජයග්‍රහණ,අභියෝග හා ඉදිරි ඉලක්ක)

2.1. ආයතනයේ ප්‍රගතිය

2.2. විශේෂ ජයග්‍රහණ

2.3. අභියෝග

2.4. ඉදිරි ඉලක්ක

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. ආයතනයේ ප්‍රගතිය

2.1.1. පැමිණිලි ලැබීම්

2021 වර්ෂය තුළ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ලද මුළු පැමිණිලි සංඛ්‍යාව 2,335 කි. මෙම පැමිණිලි 2,335 න් පැමිණිලි 966 ක් මූලික විමර්ශනය කිරීමට කොමිෂන් සභාව තීරණය කර ඇත. එම පැමිණිලි අල්ලස් හා දූෂණ පැමිණිලි 786 ක්, අයුතු වත්කම් ඉපයීම් සම්බන්ධ පැමිණිලි 106 ක් හා වැටලීම් පැමිණිලි 74 කින් සමන්විත වේ. එමෙන්ම පැමිණිලි 1,295 ක් විමර්ශනය නො කිරීමට ද ඉතිරි පැමිණිලි 74 සඳහා වෙනත් ආයතන වලින් හා නීති අංශයෙන් වාර්තා කැඳවීමට ද නියෝග ලබා දී ඇත.

2.1.1.1. ලද මුළු පැමිණිලි සංඛ්‍යාව - 2,335

2.1.1.2. විමර්ශනය සඳහා නියෝග ලද පැමිණිලි සංඛ්‍යාව හා වැටලීම් සඳහා ලද පැමිණිලි සංඛ්‍යාව - 966

විමර්ශනය සඳහා නියෝග ලද පැමිණිලි		වැටලීම් සඳහා ලද පැමිණිලි	එකතුව
අල්ලස්හා දූෂණ පැමිණිලි	අයුතු වත්කම් ඉපයීම පිළිබඳ පැමිණිලි		
786	106	74	966

2.1.1.3. විමර්ශනය නො කිරීම සඳහා නියෝග ලද පැමිණිලි සංඛ්‍යාව - 1,295

විස්තරය	පැමිණිලි සංඛ්‍යාව
කොමිෂන් සභා පනතට අදාල නොවූ බැවින් ඉදිරි කටයුතු සඳහා වෙනත් ආයතන වෙත යොමු කළ පැමිණිලි සංඛ්‍යාව	334
ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් කර නොතිබීම සහ අපහැදිලි බව හේතුවෙන් ඉවත් කරන ලද පැමිණිලි සංඛ්‍යාව	961
එකතුව	**1,295**

2.1.1.4. වෙනත් ආයතන වලින් හා නීති අංශයෙන් වාර්තා කැඳවීමට නියෝග ලද පැමිණිලි සංඛ්‍යාව - 74

විස්තරය	පැමිණිලි සංඛ්‍යාව
වෙනත් ආයතන (අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු) වලින් වාර්තා කැඳවීමට කටයුතු කළ පැමිණිලි සංඛ්‍යාව	72
විමර්ශන ආරම්භ කිරීමට ඇති හැකියාව පිළිබඳව සලකා බැලීම සඳහා නීති වාර්තා කැඳවීමට තීරණය කළ පැමිණිලි සංඛ්‍යාව	02
එකතුව	**74**

සටහන : කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2021 වර්ෂය තුළ සැලසුම් කර තිබූ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

2.1.1.5. 2021 වර්ෂයේ එක් එක් කාර්තුව තුළ ලැබී ඇති පැමිණිලි සංඛ්‍යා

පළමු කාර්තුව තුළ ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව	917
දෙවන කාර්තුව තුළ ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව	374
තෙවන කාර්තුව තුළ ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව	198
හතරවන කාර්තුව තුළ ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව	846
2021 වර්ෂය තුළ ලැබී ඇති මුළු පැමිණිලි සංඛ්‍යාව	**2,335**

2.1.2. වැටලීම්

- මුළු වැටලීම් සංඛ්‍යාව - 67
- සිදු කළ සාර්ථක වැටලීම් සංඛ්‍යාව - 33
- වැටලීම්වල දී අත් අඩංගුවට ගත් සැකකරුවන් සංඛ්‍යාව - 36

2021 වර්ෂයේ වැටලීම් මඟින් අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් පිළිබඳ තොරතුරු

අනු අංකය	ආයතනය	අත් අඩංගුවට ගත් නිලධාරියාගේ තනතුර	අත් අඩංගුවට ගත් නිලධාරීන් සංඛ්‍යාව	අත් අඩංගුවට ගත් මුළු සංඛ්‍යාව	සාර්ථක වැටලීම් ගණන
01	පළාත් පාලන කොමසාරිස් කාර්යාලය	නාගරික මන්ත්‍රී	02	02	01
02	සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය	මහජන සෞඛ්‍ය පරීක්ෂක	02	02	02
		වැඩබලන සෞඛ්‍ය පරිපාලක	01	01	01
03	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	ග්‍රාම නිලධාරී	04	04	04
04	ප්‍රාදේශීය සභාව	ප්‍රාදේශීය සභා මන්ත්‍රී	01	01	01
05		සිවිල් පුද්ගලයින්	03	03	03
06	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	වන ව්‍යාප්ත නිලධාරී	01	01	01
		වන ක්ෂේත්‍ර නිලධාරී	02	02	02
		බිට්ටු වන නිලධාරී	02	02	02
07	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු	01	01	01
08	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව	දුම්රිය කාර්ය සහායක	01	01	01
09	කම්කරු දෙපාර්තමේන්තුව	කම්කරු නිලධාරී	01	01	01

අනු අංකය	ආයතනය	අත් අඩංගුවට ගත් නිලධාරියාගේ තනතුර	අත් අඩංගුවට ගත් නිලධාරීන් සංඛ්‍යාව	අත් අඩංගුවට ගත් මුළු සංඛ්‍යාව	සාර්ථක වැටලීම් ගණන
10	ශ්‍රී ලංකා පොලිසිය	ප්‍රධාන පොලිස් පරීක්ෂක	02	02	02
		පොලිස් සැරයන්	01	01	01
		උප පොලිස් පරීක්ෂක	01	01	01
		පොලිස් කොස්තාපල්	01	01	01
11	මගී ප්‍රවාහන අධිකාරිය	කාර්යාල කාර්ය සහායක	01	01	01
		වැඩ බලන ධාවන කළමනාකරු	01	01	01
12	නැගෙනහිර පලාත් ඉඩම් දෙපාර්තමේන්තුව	ඉඩම් නිලධාරි	01	01	01
		ක්ෂේත්‍ර පරීක්ෂක	01	01	
13	අධිකරණ අමාත්‍යාංශය	හදිසි මරණ පරීක්ෂක	01	01	01
		අධිකරණ රෙජිස්ට්‍රාර්	01	01	01
14	පළාත් පාලන දෙපාර්තමේන්තුව	ආදායම් පරිපාලක	01	01	01
15	ගොවිජන සේවා දෙපාර්තමේන්තුව	ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි	01	01	01
16	ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව	ඉඩම් නිලධාරි	01	01	01
17	අධ්‍යාපන අමාත්‍යාංශය	විදුහල්පති	01	01	01
එකතුව			**36**	**36**	**33**

2021 වර්ෂයේ එක් එක් කාර්තුව තුළ වැටලීම් වලින් අත්අඩංගුවට ගත් සංඛ්‍යා

පළමු කාර්තුව තුළ අත්අඩංගුවට ගත් සැකකරුවන් සංඛ්‍යාව	17
දෙවන කාර්තුව තුළ අත්අඩංගුවට ගත් සැකකරුවන් සංඛ්‍යාව	03
තෙවන කාර්තුව තුළ අත්අඩංගුවට ගත් සැකකරුවන් සංඛ්‍යාව	06
හතරවන කාර්තුව තුළ අත්අඩංගුවට ගත් සැකකරුවන් සංඛ්‍යාව	10
2021 වර්ෂය තුළ අත්අඩංගුවට ගත් මුළු සැකකරුවන් සංඛ්‍යාව	**36**

2.1.3. විමර්ශන කටයුතු

2.1.3.1. 2021 වර්ෂය තුල එක් එක් විමර්ශන අංශය විසින් අවසන් කළ ගොනු පිළිබඳ තොරතුරු

2021 වර්ෂය තුල විමර්ශන කටයුතු අවසන් කළ ගොනු සංඛ්‍යාව - 2,464

අනු අංකය	අංශය	අවසන් කල ගොනු සංඛ්‍යාව
1	දූෂණ විමර්ශන අංශය I	476
2	දූෂණ විමර්ශන අංශය II	333
3	දූෂණ විමර්ශන අංශය III	378
4	දූෂණ විමර්ශන අංශය IV	376
5	වත්කම් විමර්ශන අංශය	374
6	විවෘත විමර්ශන අංශය	278
7	වැටලීම් I	88
8	වැටලීම් II	43
9	වැටලීම් III	63
10	වැටලීම් IV	55
එකතුව		**2,464**

2.1.3.2. විමර්ශන අවසන් කිරීමේදී විමර්ශන නිළධාරීන් විසින් නීති අංශය වෙත ඉදිරිපත් කර ඇති යෝජනා

තීරණය	එකතුව
වැසිමට යෝජනා කල ගොනු සංඛ්‍යාව	1,370
නඩු පැවරීමට යෝජනා කල ගොනු සංඛ්‍යාව	103
වැඩිදුර විමර්ශනයට යෝජනා කළ ගොනු (සංසන්දනයට/ නීති උපදෙස්/ ඒකාබද්ධ/ පූර්ණ රහසිගත)	929
වැඩිදුර විමර්ශනයට යෝජනා කළ ගොනු (ප්‍රකාශ සටහන් කර ගැනීමට නියෝග ලද)	62
එකතුව	**2,464**

සටහන - විමර්ශන නිළධාරීන් විසින් ගොනු 103ක් සඳහා නඩු පැවරීමට යෝජනා කර ඇති අතර, එම ගොනු නීති නිළධාරීන් විසින් අධ්‍යයනය කර සකස් කරන නීති වාර්තා කොමිෂන් සභාව විසින් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව නඩු පැවරීම පිළිබඳ තීරණය කරනු ඇත.

2021 වර්ෂයේ එක් එක් කාර්තුව තුළ විමර්ශන අවසන් කළ ගොනු සංඛ්‍යාව

පළමු කාර්තුව තුළ විමර්ශන අවසන් කළ ගොනු සංඛ්‍යාව	854
දෙවන කාර්තුව තුළ විමර්ශන අවසන් කළ ගොනු සංඛ්‍යාව	590
තෙවන කාර්තුව තුළ විමර්ශන අවසන් කළ ගොනු සංඛ්‍යාව	490
හතරවන කාර්තුව තුළ විමර්ශන අවසන් කළ ගොනු සංඛ්‍යාව	530
2021 වර්ෂය තුළ විමර්ශන අවසන් කළ මුළු ගොනු සංඛ්‍යාව	**2,464**

2.1.4. නඩු පැවරීම්

2021 වර්ෂය තුල අධිකරණවල පවරා ඇති මුළු නඩු සංඛ්‍යාව - 62

(මහේස්ත්‍රාත් අධිකරණය - 05, මහාධිකරණය - 57)

මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා ඇති නඩු -05

අල්ලස් නඩු	දූෂණ නඩු	වත්කම්/බැර කම් හෙලි නොකිරීම් පිළිබඳ නඩු	එකතුව
03	00	02	05

මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇති චූදිතයින් සංඛ්‍යාව - 05

- පොලිස් කොස්තාපල් 03
- වාරි මාර්ග ඉංජිනේරු 01
- බන්ධනාගාර නියාමක 01

05

මහාධිකරණයේ පවරා ඇති නඩු සංඛ්‍යාව - 57

අල්ලස් නඩු	දූෂණ නඩු	අයුතු වත්කම් ඉපයීම පිළිබඳ නඩු	එකතුව
55	02	00	57

මහාධිකරණයේ නඩු පවරා ඇති චූදිතයින් සංඛ්‍යාව - 83

- උප පොලිස් පරික්ෂක 02
- පොලිස් පරික්ෂක 02
- පොලිස් සැරයන් 05
- ප්‍රධාන පොලිස් පරීක්ෂක 01
- පොලිස් කොස්තාපල් 04
- කාර්මික නිලධාරි 01
- විදුහල්පති 03

• ජ්‍යෙෂ්ඨ නියාමක	01
• ග්‍රාම නිලධාරි	03
• සිවිල් පුද්ගලයින්	12
• සංවර්ධන නිලධාරි	03
• ගොවිජන සංවර්ධන නිලධාරි	01
• ඕවර්සියර්	01
• වන ක්ෂෙත්‍ර සහකාර	01
• ධීවර පරීක්ෂක	01
• කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර	01
• සභාපති - පශු සම්පත් සංවර්ධන මණ්ඩලය	01
• ගිණුම් සහකාර - පශු සම්පත් සංවර්ධන මණ්ඩලය	01
• විමර්ශන නිලධාරී (පාරිභෝගික කටයුතු අධිකාරිය)	04
• මුරකරු	01
• කාර්යාල කාර්ය සහායක	01
• හිටපු සභාපති හා විපක්ෂ නායක - ප්‍රාදේශීය සභාව තංගල්ල	01
• ඒකක කළමනාකරු	03
• සුරාබදු පරීක්ෂක	03
• සුරාබදු නියාමක	04
• සුරාබදු මහ සැරයන්	01
• සුරාබදු සැරයන්	01
• සුරාබදු රියදුරු	01
• ප්‍රාදේශීය සභා ලේකම්	01
• රේගු අධිකාරි	03
• සහකාර රේගු අධිකාරි	01
• කම්බි මාර්ගකරු	01
• ප්‍රධාන අමාත්‍යය - උතුරු මැද පළාත් සභාව	01
• ප්‍රධාන අමාත්‍ය පුද්ගලික ලේකම්	01
• ගවේශණ නිලධාරි	01
• සමෘද්ධි නිලධාරි	01
• හිටපු ප්‍රාදේශීය සභ මන්ත්‍රී	01
• හිටපු ප්‍රාදේශීය සභා සභාපති	01
• මනු කියවන්නා	02
• හිටපු ජනපද නිලධාරි	01
• වන සත්ව නියාමක	01
• ගණකාධිකාරි - සමාජ සේවා දෙපාර්තමේන්තුව	01
• සහකාර ලේකම් - සමාජ සේවා දෙපාර්තමේන්තුව	01
• සමාජ සේවා අධ්‍යක්ෂ	01
	83

2.1.5. නඩු අවසන් කිරීම්

2021 වර්ෂය තුල අධිකරණය විසින් අවසන් කළ නඩු සංඛ්‍යාව – 69

මහේස්ත්‍රාත් අධිකරණ - 26

	අල්ලස් නඩු	දූෂණ නඩු	වත්කම්/බැරකම් හෙලි නොකිරීම් පිළිබඳ නඩු	එකතුව
වරදකරු	00	00	02	02
නිවරදිකරු	02	00	00	02
වෙනත්/ ඉල්ලා අස් කර ගත්	02	20	00	22
එකතුව				**26**

මහාධිකරණය - 43

	අල්ලස් හා දූෂණ නඩු	අයුතු වත්කම් ඉපයීම් පිළිබඳ නඩු	එකතුව
වරදකරු	09	00	09
නිවරදිකරු	14	02	16
වෙනත්/ ඉල්ලා අස් කර ගත්	15	03	18
එකතුව			**43**

2.1.6. විභාග වෙමින් පවතින නඩු

2021.12.31 දින වන විට අධිකරණ වල විභාග වෙමින් පවතින නඩු සංඛ්‍යාව – 261

- මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වන නඩු සංඛ්‍යාව - 60
- මහාධිකරණයේ විභාග වන නඩු සංඛ්‍යාව - 201

2.1.7. විත්තිකරුවන් වරදකරුවන් කිරීම්

2021 වර්ෂය තුළ නඩු 10 කින් විත්තිකරුවන් 09 දෙනෙකු වරදකරුවන් කිරීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හැකි වී ඇත.

2021 වර්ෂය තුළ විත්තිකරුවන් වරදකරුවන් වූ නඩු පිළිබඳ විස්තර

අනු අංකය	ආයතනය	වරදකරුවන් වූ නිලධාරියාගේ තනතුර	වරදකරුවන් වූ සංඛ්‍යාව	වරදකරුවන් වූ නඩු සංඛ්‍යාව
1	ගොවිජන සේවා මධ්‍යස්ථානය, රණෝරාව	ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි	01	01
2		සිවිල් පුද්ගලයන්	03	03

අනු අංකය	ආයතනය	වරදකරුවන් වූ නිලධාරියාගේ තනතුර	වරදකරුවන් වූ සංඛ්‍යාව	වරදකරුවන් වූ නඩු සංඛ්‍යාව
3	සෞඛ්‍ය අමාත්‍යාංශය	කළමනාකරණ සේවා නිලධාරී	01	01
4	සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය, වැරැල්ලගොඩ	මහජන සෞඛ්‍ය පරීක්ෂක	01	01
5	දිස්ත්‍රික් කම්කරු කාර්යාලය	කම්කරු නිලධාරි	01	01
6	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	ජනපද නිලධාරී	01	01
7	වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය	වාරිමාර්ග ඉංජිනේරු	01	02
එකතුව			**09**	**10**

2021 වර්ෂයේ එක් එක් කාර්තුව තුල විත්තිකරුවන් වරදකරුවන් වූ සංඛ්‍යාව

පළමු කාර්තුව තුළ විත්තිකරුවන් වරදකරුවන් වූ සංඛ්‍යාව	03
දෙවන කාර්තුව තුළ විත්තිකරුවන් වරදකරුවන් වූ සංඛ්‍යාව	01
තෙවන කාර්තුව තුළ විත්තිකරුවන් වරදකරුවන් වූ සංඛ්‍යාව	01
හතරවන කාර්තුව තුළ විත්තිකරුවන් වරදකරුවන් වූ සංඛ්‍යාව	04
2021 වර්ෂය තුළ විත්තිකරුවන් වරදකරුවන් වූ මුළු සංඛ්‍යාව	**09**

2.1.8. පවත්වන ලද දූෂණ නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්

ක්‍රම සංඛ්‍යා	දිනය	වැඩසටහන/ කාර්යය	ස්ථානය	අරමුණ
01	2021.02.03	මිණුම් ඒකක දෙපාර්තමේන්තුවේ මිණුම් පරීක්ෂකවරුන් 30 ක් දැනුවත් කිරීම	කොළඹ	පාසල් තුල සුපිළිපන්න සමාජ ස්ථාපිත කිරීම පිළිබඳ දැනුවත් කිරීම හා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැන්වීම
02	2021.02.19	පොලිස් සැරයන් තනතුරේ සිට උප පොලිස් පරීක්ෂක තනතුරට උසස් වීම් ලද නිලධාරීන් දැනුවත් කිරීම	නුවරඑළිය	රාජ්‍ය නිලධාරීන් අල්ලස හා දූෂණ පිළිබඳ දැනුවත් කිරීම හා නිවාරණ ක්‍රියා මාර්ග

අනු අංකය	දිනය	වැඩසටහන/ කාර්යය	ස්ථානය	අරමුණ
03	2021.02.20	සමස්ත ලංකා පාසල් බස් රථ රියදුරන්ගේ ජාතික සංගමයේ රියදුරන් 100 ක් දැනුවත් කිරීම	බත්තරමුල්ල	අල්ලස හා දූෂණය නිවාරණය කිරීම තුලින් සුපිළිපන්න සමාජයක් බිහි කිරීම හා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැන්වීම
04	2021.02.22	බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පොලිස් සැරයන් තනතුරට උසස්වීම් ලද නිලධාරීන් 70 ක් දැනුවත් කිරීම	අහුණුකොලපැලැස්ස	අල්ලස හා දූෂණය නිවාරණය කිරීම තුලින් සුපිළිපන්න සමාජයක් බිහි කිරීම හා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැන්වීම
05	2021.02.22	රාජ්‍ය දැව සංස්ථාවේ මාණ්ඩලික නිලධාරීන් 30 ක් දැනුවත් කිරීම.	බත්තරමුල්ල	රාජ්‍ය නිලධාරීන් අල්ලස හා දූෂණ පිළිබඳ දැනුවත් කිරීම හා නිවාරණ ක්‍රියා මාර්ග
06	2021.02.23	රාජ්‍ය දැව සංස්ථාවේ කාර්යාල නිලධාරීන් 30 ක් දැනුවත් කිරීම.	බත්තරමුල්ල	රාජ්‍ය නිලධාරීන් අල්ලස හා දූෂණ පිළිබඳ දැනුවත් කිරීම හා නිවාරණ ක්‍රියා මාර්ග
07	2021.03.10	රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ නිලධාරීන් දැනුවත් කිරීම	කොළඹ	අල්ලස් හෝ දූෂණය විමර්ශන කොමිෂන් සභාවේ කාර්යභාරය හා පැමිණිලි පෙට්ටි ස්ථාන ගත කිරීම පිළිබඳව පැහැදිලි කිරීම.
08	2021.04.06	ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යාල මාණ්ඩලික නිලධාරීන් 17 ක් දැනුවත් කිරීම	කොළඹ	සුපිළිපන්න රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම පිළිබඳ දැනුවත් කිරීම හා පැමිණිලි පෙට්ටි ස්ථාන ගත කිරීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම.
09	2021.04.06	නවක පොලිස් කොස්තාපල් වරුන් 322 ක් දැනුවත් කිරීම	නිකවැරටිය	සුපිළිපන්න රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම පිළිබඳ දැනුවත් කිරීම හා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැන්වීම
10	2021.04.07	ශ්‍රී ලංකා රේගුව - මාණ්ඩලික නිලධාරීන් දැනුවත් කිරීම	කොළඹ	අල්ලස හෝ දූෂණය විමර්ශන කොමිෂන් සභාවේ කාර්ය භාර්යය හා පැමිණිලි පෙට්ටි ස්ථාන ගත කිරීම පිළිබඳව පැහැදිළි කිරීම.
11	2021.04.09	පොලිස් කොස්තාපල් තනතුරේ සිට පොලිස් සැරයන් තනතුරට උසස් වීම් ලද නිලධාරීන් දැනුවත් කිරීම	පානදුර	අල්ලස හා දූෂණය නිවාරණය කිරීම තුලින් සුපිළිපන්න සමාජයක් බිහි කිරීම හා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැන්වීම

අනු අංකය	දිනය	වැඩසටහන/ කාර්යය	ස්ථානය	අරමුණ
12	2021.04.27	පොලිස් කොස්තාපල් තනතුරේ සිට පොලිස් සැරයන් තනතුරට උසස්වීම් ලද නිලධාරීන් දැනුවත් කිරීම	අත්තිඩිය	අල්ලස හා දූෂණය නිවාරණය කිරීම තුලින් සුපිළිපන්න සමාජයක් බිහි කිරීම හා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැන්වීම
13	2021.07.30	සිවිල් සංවිධාන සමාජිකයින් දැනුවත් කිරීම	ZOOM තාක්ෂණය ඔස්සේ	අල්ලස හා දූෂණය නිවාරණය කිරීම තුලින් සුපිළිපන්න සමාජයක් බිහි කිරීම හා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැන්වීම
14	2021.07.31	අහුණකොලපැලැස්ස බන්ධනාගාර නිලධාරීන් දැනුවත් කිරීම	අහුණකොලපැලැස්ස	අල්ලස හා දූෂණය නිවාරණය කිරීම තුලින් සුපිළිපන්න සමාජයක් බිහි කිරීම හා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැන්වීම
15	2021.08.21	පොලිස් කොස්තාපල් තනතුරේ සිට පොලිස් සැරයන් තනතුරට උසස්වීම් ලද නිලධාරීන් දැනුවත් කිරීම	කොළඹ	අල්ලස හා දූෂණය නිවාරණය කිරීම තුලින් සුපිළිපන්න සමාජයක් බිහි කිරීම හා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැන්වීම
16	2021.10.01	ලෝක ළමා දිනය වෙනුවෙන් පැවැත්වූ වැඩසටහන	ZOOM තාක්ෂණය ඔස්සේ	පාසල් තුළ සුපිළිපන්න සමාජ ස්ථාපිත කිරීම පිළිබඳ දැනුවත් කිරීම හා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැන්වීම
17	2021.10.23	ගාල්ල බූස්ස බන්ධනාගාර නිළධාරීන් දැනුවත් කිරීම	ගාල්ල	අල්ලස හා දූෂණය නිවාරණය කිරීම තුලින් සුපිළිපන්න සමාජයක් බිහි කිරීම හා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැන්වීම
18	2021.11.23	Kind Hearts (NGO) මඟින් සිවිල් සේවකයින් දැනුවත් කිරීම	වාලච්චේන	අල්ලස හා දූෂණය නිවාරණය කිරීම තුලින් සුපිළිපන්න සමාජයක් බිහි කිරීම හා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැන්වීම
19	2021.11.23	කල්ලඩි පොලිස් ස්ථානයේ පොලිස් නිළධාරීන් දැනුවත් කිරීම	කල්ලඩි	අල්ලස හා දූෂණය නිවාරණය කිරීම තුලින් සුපිළිපන්න සමාජයක් බිහි කිරීම හා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැන්වීම
20	2021.12.08	ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ නිළධාරීන් දැනුවත් කිරීම	ZOOM තාක්ෂණය ඔස්සේ	අල්ලස හා දූෂණය නිවාරණය කිරීම තුලින් සුපිළිපන්න සමාජයක් බිහි කිරීම හා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැන්වීම
21	2021.12.10	කොළඹ මහ නගර සභාවේ නිළධාරීන් දැනුවත් කිරීම	කොළඹ	අල්ලස හා දූෂණය නිවාරණය කිරීම තුලින් සුපිළිපන්න සමාජයක් බිහි කිරීම හා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැන්වීම

අනු අංකය	දිනය	වැඩසටහන/ කාර්යය	ස්ථානය	අරමුණ
22	2021.12.15	අරලගංවිල පොලිස් ස්ථානයේ නිළධාරීන් දැනුවත් කිරීම	අරනගංවිල	අල්ලස හා දූෂණය නිවාරණය කිරීම තුලින් සුපිළිපන්න සමාජයක් බිහි කිරීම හා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැන්වීම
23	2021.12.16	අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුව	අග්‍රාමාත්‍ය කාර්යාලය	අල්ලස හා දූෂණය නිවාරණය කිරීම තුලින් සුපිළිපන්න සමාජයක් බිහි කිරීම හා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැන්වීම
24	2021.12.17	අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුව	අග්‍රාමාත්‍ය කාර්යාලය	අල්ලස හා දූෂණය නිවාරණය කිරීම තුලින් සුපිළිපන්න සමාජයක් බිහි කිරීම හා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැන්වීම
25	2021.12.26	කලුතර ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ නිළධාරීන් දැනුවත් කිරීම	කලුතර පොලිස් විද්‍යාලය	අල්ලස හා දූෂණය නිවාරණය කිරීම තුලින් සුපිළිපන්න සමාජයක් බිහි කිරීම හා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැන්වීම

2.2. අභියෝග

- දූෂිත රාජ්‍ය නිලධාරීන් පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමට සහ අවශ්‍ය අවස්ථාවල දී සාක්ෂි ලබා දීමට ජනතාව දක්වන සහයෝගය අවම මට්ටමක පැවතීම
- දේශපාලඥයින්ගේ මහා පරිමාණ අල්ලස් හෝ දූෂණ පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමට ව්‍යාපාරිකයින්, ආයෝජකයින් වැනි පාර්ශව ඉදිරිපත් නොවීම
- අල්ලසට හා දූෂණයට එරෙහි වැඩපිළිවෙලක් රාජ්‍ය අංශය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ ඇති උනන්දුව අවම මට්ටමක පැවතීම
- විවිධ විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂඥ දැනුමක් සහිත විශේෂිත විමර්ශන නිලධාරීන් ආයතනය සතු නොවීම.
- දූෂණ නඩු උසාවියේ ඔප්පු කිරීම සඳහා ලේඛන මත පදනම් වූ සාක්ෂි ඉදිරිපත් කළ යුතු වුවත් එවැනි සාක්ෂි සපයා ගැනීම දුෂ්කර වීම
- පැමිණිලි විමර්ශනය කර නඩු පැවරීම මගින් පමණක් අල්ලස හා දූෂණය තුරන් කළ නොහැකි බවත්, ඒ සඳහා අල්ලස හා දූෂණය නිවාරණය පිළිබඳ ජනතාවගේ දැනුවත්භාවය ඉහළ නැංවිය යුතු බවත් බොහෝ පිරිසක් නොදැන සිටීම
- අල්ලස් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයන්ට ප්‍රමාණවත් කාර්යාල ඉඩ පහසුකම් නොමැතිවීම.

2.3. ඉදිරි ඉලක්ක

- නව සංගෘහිත පනතක් ලෙස කෙටුම්පත් කර ඇති අල්ලස් පනත, වත්කම් බැරකම් පනත සහ අල්ලස් කොමිෂන් සභා පනත නීතිගත කිරීම තුළින් ශ්‍රී ලංකාවේ අල්ලස හා දූෂණයට එරෙහි අධිකරණ කටයුතු පහසු කර ගැනීම.

- මාර්ගගත (Online) ක්‍රමය භාවිතා කරමින් රාජ්‍ය නිළධාරීන්ගේ හා දේශපාලඥයින්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා ගැනීම සහ එම වත්කම් බැරකම් ප්‍රකාශ වලට අදාල තොරතුරු අල්ලස් කොමිෂන් සභාවේ පිහිටවනු ලබන විශේෂ ඒකකයක පරිගණක ගත දත්ත පද්ධතියක් ලෙස ස්ථාපිත කිරීම.

- අල්ලස හා දූෂණය අවම කිරීම සඳහා වන "ශ්‍රී ලංකාව තුලින් අල්ලස හා දූෂණය පිටු දැකීමේ" ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීම.

- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සඳහා නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකර ගැනීම.

- පාසල් හා උසස් අධ්‍යාපනය හදාරන සිසුන්ගේ ආකල්ප වැඩිදියුණු කිරීම සඳහා සාරධර්ම සංකල්ප හා අල්ලස දූෂණය පිළිබඳ නීති අධ්‍යාපන විෂය මාලාවන්ට ඇතුළත් කිරීම.

- අල්ලස් කොමිෂන් සභාවේ ලිපි ගොනු කළමනාකරණය සඳහා පරිගණක ගත දත්ත පද්ධතියක් ස්ථාපනය කිරීම.

ඉහත 02 වන පරිච්ඡේදයේ (2.1 – 2.3) දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.



ප්‍රධාන ගණන් දීමේ නිළධාරී
නම : ඩබ්.කේ.ඩී විජේරත්න
තනතුර : අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2022 පෙබරවාරි 28

තෙවන පරිච්ඡේදය

3. වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

3.3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් (i)-(ix)

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

3.7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

3. වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	තත්‍ය 2021 රු.	තත්‍ය නැවත ගලපන ලද 2020 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-		
-	භාණ්ඩාගාර අග්‍රිම		331,412,000	296,873,522	ඒසීඒ-3
-	තැන්පතු		52,745	1,369,306	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		16,243,517	10,489,457	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්				
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		347,708,262	308,732,285	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**347,708,262**	308,732,285	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		6,311	18,928	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		347,701,950	308,713,357	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-		
557,740,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	413,874,353	379,210,819	
112,300,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	96,273,019	83,809,772	ඒසීඒ-2(ii)
3,200,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	746,419	1,111,054	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	15,110	
673,240,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**510,893,791**	464,146,755	
	මූලධන වියදම්				
6,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	2,739,012	4,627,605	
19,225,500	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	18,213,507	5,979,576	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
3,000,000	හැකියා වර්ධනය	14	367,800	1,623,875	
6,774,500	වෙනත් මූලධන වියදම්	15	528,844	11,087,609	
35,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**21,849,163**	23,318,665	
	තැන්පතු ගෙවීම්		923,955	1,410,548	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		17,574,949	16,133,532	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්			-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		18,498,904	17,544,080	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		551,241,858	505,009,501	
708,240,000.00	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(203,539,907)	(196,296,144)	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		203,539,907	**196,251,144**	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	45,000	ඒසීඒ-3
			203,539,907	196,296,144	

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශ

ඒසිඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය	
		2021	**2020**
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	1,561,920,933	1,524,476,553
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	70,873,736	69,542,303
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3		45,000
මුළු වත්කම්		**1,632,794,669**	**1,594,063,856**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		70,852,700	68,650,057
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,561,920,933	1,524,476,553
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	21,036	892,246
අග්‍රිම ශේෂය	ඒසිඒ-3		45,000
මුළු වගකීම්		**1,632,794,669**	**1,594,063,856**

පිටු අංක 6 සිට 36 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 37 සිට 45 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන් දීමේ නිළධාරී
නම : ඩබ්.කේ.ඩී. විජේරත්න
තනතුර : අධ්‍යක්ෂ ජනරාල්

ප්‍රධාන ගණකාධිකාරී
නම :ඩබ්.එම්.ඩී. බණ්ඩාර
දිනය 2022 පෙබරවාරි 28

3.3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2021 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසිඒ-සී

	තත්‍ය	
		නැවත ගලපන ලද
	2021 රු.	**2020** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	8,372,590	7,423,181
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	332,640	1,064,448
අග්‍රිම ලැබීම්	331,412,000	296,873,522
අත්තිකාරම් අයකර ගැනීම්	14,217,069	8,123,373
තැන්පතු ලැබීම්	52,745	1,369,306
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**354,387,044**	**314,853,830**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	317,763,920	293,828,824
සහනාධාර සහ මාරුකිරීම්	746,419	1,111,054
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	-	711,442
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	6,311	18,928
අත්තිකාරම් ගෙවීම්	17,128,161	11,773,457
තැන්පතු ගෙවීම්	923,955	1,410,548
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**336,568,766**	**308,854,254**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**17,818,277**	**5,999,576.24**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	350,230	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**350,230**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	18,213,507	5,979,576
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**18,213,507**	**5,979,576**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(17,863,277)**	**(5,979,576)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(45,000)**	**20,000**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**(45,000)**	**20,000**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**45,000**	**25,000**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**0**	**45,000**

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

සටහන -(i)

පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය
(මූ.රෙ. 106 හා මූ.රෙ. 113 යටතේ වන පාඩු)

වියදම් ශීර්ෂ අංකය : 010 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

වැඩසටහන් අංකය හා නාමය : 1 මෙහෙයුම් වැඩසටහන්

(i) <u>වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපාහැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය</u>

	අගය	සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු.)
රු:	25,000.00 අඩු	0	0.00
රු:	25,000.01 වැඩි	0	-
	එකතුව	0	0.00

<u>අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය</u>

සිද්ධි සංඛ්‍යාව	අගය	සිද්ධි සංඛ්‍යාව	අගය
	රු: 25,000.00ට අඩු		රු: 25,000.00ට වැඩි
	(රු: ශත)		**(රු: ශත)**
	-	0	-
එකතුව	0.00		0.00

(ii) <u>තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය</u>

අගය	සිද්ධි සංඛ්‍යාව	<u>මුළු එකතුව</u> **(රු: ශත)**
රු: 25,000ට අඩු	10	105,241.88
රු: 25,000ට වැඩි	07	588,485.74
එකතුව	17	693,727.62

(iii) <u>කාල අනුව විශ්ලේෂණය</u>

වසර 5 ට අඩු	සිද්ධි සංඛ්‍යාව	14
	ගණන	රු. 656,048.32
වසර 5-10	සිද්ධි සංඛ්‍යාව	01
	ගණන	රු. 2,725.00
වසර 10ට වැඩි	සිද්ධි සංඛ්‍යාව	02
	ගණන	රු. 34,954.30

<u>අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය</u>

	<u>සිද්ධි සංඛ්‍යාව</u>	<u>අගය (රු)</u> **25000ට අඩු (රු. ශත)**		<u>සිද්ධි සංඛ්‍යාව</u>	<u>අගය (රු)</u> **25000ට වැඩි (රු. ශත)**
1	GB-9408	148.80	1	19-9522	34,805.50
2	PA-5787	2,725.00	2	PG-0429	42,000.00
3	KM-8687	19,950.00	3	NB-5063	65,800.00
4	PG-0429	9,500.00	4	301-9385	32,150.00
5	NB-1370	6,581.22	5	KM-8687	49,580.24
6	KQ1814	11,371.35	6	NB-1370	78,700.00
7	PG-1338	8,965.51	7	CAC-6985	285,450.00
8	19-8655	16,500.00			
9	KS-7609	12,500.00			
10	PG-1343	17,000.00			
	එකතුව	**<u>105,241.88</u>**			**<u>588,485.74</u>**

සටහන -

වැය විෂය 1701 යටතේ වර්ෂය තුල ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ.113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

ප්‍රධාන ගණකාධිකාරී
නම :ඩබ්.එම්.ඩී. බණ්ඩාර
දිනය 2022 පෙබරවාරි 28

පොත් වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශය

සටහන -(ii)

වියදම් ශීර්ෂ අංකය : 010 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
වැඩසටහන් අංකය හා නාමය : 1 මෙහෙයුම් වැඩසටහන්

1 වර්ෂය තුළ සිදුවූ මු.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

	අගය	සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු: ශත)
i.	රු. 25,000.00 අඩු	00	00
ii.	රු. 25,000.001 වැඩි	-	-
	එකතුව	00	00

2 වර්ෂය තුළ මු.රේ.109 යටතේ වන පොතෙන් කපා හැරීම හා අයකර ගැනීම පිළිබඳ ප්‍රකාශය

අලාභයේ ස්වභාවය	ආරම්භක කපා නොකල ශේෂය (රු.)	අලාභයේ වටිනාකම (රු.)	අයකර ගැනීම (රු.)	පොතෙන් කපා හල අගය (රු.)	කපා නොහල ඉදිරියට ගෙන යන ශේෂය(රු.)	පොතෙන් කපා හැරීම සඳහා වූ අනුමැතියේ යොමු අංකය
1.	-	-	-	-	-	-
2.						
3.						
4.						
එකතුව						

සටහන - සටහන (i) හි ඇතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මු.රෙ.109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

ප්‍රධාන ගණකාධිකාරී
නම :ඩබ්.එම්.ඩී. බණ්ඩාර
දිනය 2022 පෙබරවාරි 28

බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
වියදම් ශීර්ෂ අංකය : 010
වැඩසටහන් අංකය හා නාමය : 1 මෙහෙයුම් වැඩසටහන්

ආයතන/පුද්ගලයාගේ නම	බැඳීම් අංකය	දිනය	ශීර්ෂය	වැඩසටහන	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂයය	අයිතම අංකය	මූල්‍යකරණය	බැඳීම් (රු.)	බැඳීම් ශේෂය (රු.)	බැරකම්වලට ඇතුළත් දිනය	බැරකම් වර්ගීකරණය (රු.)	සංශෝධිත බැරකම් (රු.)	බැරකම් නිදහස් කිරීම් (රු.)	බැරකම් ශේෂය (රු.)
										(1)	(2)=(1)-(3)		(3)	(4)	(5)	(6)=(4)-(5)
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු																
එකතුව										-			-			
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල																
රජයේ වාණිජ සංස්ථාව	C1290	12/31/2021	010	1	1	0	1409		11	35,005.00	0.00	12/31/2021	35,005.00			
එකතුව										**35,005.00**			**35,005.00**			
3. වෙනත් (පෞද්ගලික අංශය)																
යුරේකා ටෙක්නොලොජි	C1354	12/31/2021	010	1	**1**	0	1402		11	1,500.00	201.00	12/31/2021	1,299.00			
එකතුව										**1,500.00**			**1,299.00**			
මුළු එකතුව										**36,505.00**	**201.00**		**36,304.00**			

ගෙවීම්/බැඳීම්වල ස්වභාවය පහත සඳහන් ආකාරයට හඳුනාගත යුතු ය.

1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු
2. රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල
3. පෞද්ගලික අංශය

බැරකම් යනු අදාළ ගිණුම් වර්ෂය ඇතුළත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලට අදාළ වත්කම් හා සේවාවන් ලැබී ඇති නමුත් ගිණුම් වර්ෂය තුළදී ඒ සඳහා අදාළ පාර්ශ්වයන්ට ගෙවීම් සිදුකර නොමැති ගනුදෙනුය.

බැඳීම් යනු අදාළ ගිණුම් වර්ෂය ඇතුළත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් අදාළ වත්කම් හෝ සේවාව ආයතනය වෙත ලැබී නොමැති, එහෙත් එකී භාණ්ඩ හා සේවාවන් ලබාගැනීමේ අරමුණින් බාහිර පාර්ශ්වයන් සමඟ එළඹ ඇති ගිවිසුම් හෝ ලිඛිත එකඟතාවයන්ය.

ප්‍රධාන ගණකාධිකාරී
නම :ඩබ්.එම්.ඩී. බණ්ඩාර
දිනය 2022 පෙබරවාරි 28

සටහන - (iv)

බැරකම් පිළිබඳ ප්‍රකාශය - (i)

මු.රෙ. 94 (2) සහ (3) ප්‍රකාරව එළඹෙන ලද බැඳීම් ප්‍රකාශය

අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

වියදම් ශීර්ෂ අංකය : 010

වැඩසටහන් අංකය හා නාමය : 1 මෙහෙයුම් වැඩසටහන්

පුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම් පිළිබඳ විස්තරය	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය	මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.)	මු.රෙ. 94(3) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.)	බැඳීම් හා බැරකම් වටිනාකම (රු.)
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු								
ආර්.කේ.ආර්.කේ.පෙරේරා හා වෙනත්	අතිකාල	1	0	1002	11			397,941.78
පී.දිසානායක හා වෙනත්	ගමන් වියදම්	1	0	1101	11			21,350.00
ආර්.ඩී.ජේ.පුෂ්පකුමාර හා වෙනත්	ගමන් වියදම්	1	0	1101	11			136,374.00
නාලක නුවන්සිරි	අහාර පාන හා නිල ඇඳුම්	1	0	1203	11			1,000.00
ටී.එම්.ටී.එස්.තෙන්නකෝන්	අහාර පාන හා නිල ඇඳුම්	1	0	1203	11			1,000.00
පුෂ්පකුමාර	අහාර පාන හා නිල ඇඳුම්	1	0	1203	11			1,652.00
එ.එල්.ආර්.ඩී.චන්ද්‍රසිරි	වාහන නඩත්තු	1	0	1301	11			2,500.00
ආර්.ජී.ඩී.සංජීව	වාහන නඩත්තු	1	0	1301	11			2,500.00
කේ.පී.එස්.ඩී.පතිරණ	වාහන නඩත්තු	1	0	1301	11			2,500.00
බී.ඩී.ඒ.සිසිර කුමාර හා වෙනත්	අතිකාල	1	0	1002	11			104,965.01
වයි.එම්.ටී.පිටවල	අතිකාල	1	0	1002	11			81,423.54
එකතුව								753,206.33

පුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම් පිළිබඳ විස්තරය	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	ඛෑය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය	මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.)	මු.රෙ. 94(3) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.)	බැඳීම් හා බැරකම් වටිනාකම (රු.)
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල								
ශ්‍රී ලංකා ටෙලිකොම්	තැපැල් හා සන්නිවේදන	1	0	1402	11			128,172.06
ජල සම්පාදන හා හා ජලාප්‍රවාහන මණ්ඩලය	විදුලිය හා ජලය	1	0	1403	11			8,854.56
ජල සම්පාදන හා හා ජලාප්‍රවාහන මණ්ඩලය	විදුලිය හා ජලය	1	0	1403	11			6,649.47
ජල සම්පාදන හා හා ජලාප්‍රවාහන මණ්ඩලය	විදුලිය හා ජලය	1	0	1403	11			38,452.32
ලංකා විදුලි බල මණ්ඩලය	විදුලිය හා ජලය	1	0	1403	11			407,012.80
ලංකා විදුලි බල මණ්ඩලය	විදුලිය හා ජලය	1	0	1403	11			541,285.20
ජල සම්පාදන හා හා ජලාප්‍රවාහන මණ්ඩලය	විදුලිය හා ජලය	1	0	1403	11			12,718.66
ජල සම්පාදන හා හා ජලාප්‍රවාහන මණ්ඩලය	විදුලිය හා ජලය	1	0	1403	11			3,661.41
රජයේ වාණිජ සංස්ථාව	වෙනත්	1	0	1409	11			35,005.00
ශ්‍රී ලංකා ටෙලිකොම්	තැපැල් හා සන්නිවේදන	1	0	1402	11			17,387.07
ශ්‍රී ලංකා ටෙලිකොම්	තැපැල් හා සන්නිවේදන	1	0	1402	11			2,767.00
ලංකා විදුලි බල මණ්ඩලය	විදුලිය හා ජලය	1	0	1403	11			18,148.50
එකතුව								1,220,114.05
3. වෙනත් (පෞද්ගලික අංශය)								
පී.ටී.අරසාන් සහ පුත්‍රයෝ	ඉන්ධන	1	0	1202	11			6,776.00
සී/ස මහර විවිධ සේවා සමුපකාර සමිතිය	ඉන්ධන	1	0	1202	11			6,771.00
සී/ස ඇහැලියගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය	ඉන්ධන	1	0	1202	11			5,439.00
සී/ස මැදිරිගිරිය විවිධ සේවා සමුපකාර සමිතිය	ඉන්ධන	1	0	1202	11			6,171.00

පුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම් පිළිබඳ විස්තරය	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	මෑය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය	මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.)	මු.රෙ. 94(3) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.)	බැඳීම් හා බැරකම් වටිනාකම (රු.)
සී/ස මහව විවිධ සේවා සමූපකාර සමිතිය	ඉන්ධන	1	0	1202	11			4,440.00
එස්.අබේසූරිය ලංකා පිරවුම්හල	ඉන්ධන	1	0	1202	11			5,929.00
ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ්	තැපැල් හා සන්නිවේදන	1	0	1402	11			7,603.80
ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ්	තැපැල් හා සන්නිවේදන	1	0	1402	11			1,542.80
ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ්	තැපැල් හා සන්නිවේදන	1	0	1402	11			5,840.60
සී/ස අනුරාධපුර විවිධ සේවා සමූපකාර සමිතිය	ඉන්ධන	1	0	1202	11			16,066.00
සී/ස සියඹලාන්ඩුව විවිධ සේවා සමූපකාර සමිතිය	ඉන්ධන	1	0	1202	11			5,550.00
සී/ස වවුනියාව විවිධ සේවා සමූපකාර සමිතිය	ඉන්ධන	1	0	1202	11			4,662.00
ඔටෝ සර්විසස් දඹුල්ල	ඉන්ධන	1	0	1202	11			6,105.00
එකතුව								82,896.20
මුළු එකතුව								2,056,216.58

ප්‍රධාන ගණකාධිකාරී
නම :ඩබ්.එම්.ඩී. බණ්ඩාර
දිනය 2022 පෙබරවාරි 28

බැරකම් පිළිබඳ ප්‍රකාශය - (ii)

සටහන - (v)

මු.රෙ. 215 (3) (ආ) සහ (ඇ) ප්‍රකාරව තැන්පත් ගිණුමට මාරු කරන ලද ප්‍රතිපාදන

අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

වියදම් ශීර්ෂ අංකය : 010
වැඩසටහන් අංකය හා නාමය : 1 මෙහෙයුම් වැඩසටහන

පුද්ගලයාගේ / ආයතනයේ නම (ප්‍රතිපාදන මාරු කරන විට හඳුනා ගෙන තිබිය යුතුය)	වගකීම් පිළිබඳ විස්තරය	ණයවර ලිපි අංක ආදිය	ප්‍රතිපාදන මාරු කරනු ලැබුවේ කුමන වැය ශීර්ෂයකින්ද				තැන්පතු ගිණුම් අංකය	මාරු කරන ලද මුදල (රු. ශත).
			ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය		
1. අමාත්‍යාංශ /රජයේ දෙපාර්තමේන්තු .... එකතුව	-	-	-	-	-	-	-	 XX XX
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල .... එකතුව	-	-	-	-	-	-	-	 XX XX
3. වෙනත් (පෞද්ගලික අංශය) .... එකතුව	-	-	-	-	-	-	-	 XX XX
මුළු එකතුව								

ප්‍රධාන ගණකාධිකාරී
නම :ඩබ්.එම්.ඩී. බණ්ඩාර
දිනය 2022 පෙබරවාරි 28

ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර වලට අදාළ හිමිකම් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : අල්ලස් හෝ දූෂණ වෝදනා විමර්ශන කොමිෂන් සභාව

වැඩසටහන් අංකය හා නාමය : 010

		රු.
(1)	ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර යටතේ, පරිපූරක වෙන් කිරීම් ද ඇතුළුව 2021 ඇස්තමේන්තු ගත වෙන් කිරීම්	-
(2)	ඉහත (1) ට අදාළ 2021 වර්ෂය තුළ දී දරන ලද මුළු වියදම	-
(3)	2021 ජනවාරි 01 දිනට ලැබීමට නියමිතව තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර වලට අදාළ හිමිකම්පෑම් වල එකතුව	-
(4)	2020 හා ඊට පෙර වර්ෂ වලට අදාළව, 2021 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර වලට අදාළ හිමිකම්පෑම් වල එකතුව (ඇත්නම්)	-
(5)	2021 වර්ෂය සම්බන්ධයෙන් 2021 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර වලට අදාළ හිමිකම්පෑම් වල එකතුව	-
(6)	2020 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් වූ හිමිකම්පෑම් සම්බන්ධයෙන් 2021 වර්ෂයේදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම්පෑම් වල එකතුව	-
(7)	2021 වර්ෂය සම්බන්ධයෙන් 2021 වර්ෂය තුළදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම්පෑම්වල එකතුව	-
(8)	2020 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් 2021 වර්ෂය තුළ දී ලැබුණු ප්‍රතිපූරණ වල මුළු එකතුව	-
(9)	2021 වර්ෂය වෙනුවෙන් 2021 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණ වල එකතුව	-
(10)	2021 දෙසැම්බර් 31 දිනට ලැබීමට නියමිතව තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර වලට අදාළ හිමිකම්පෑම්වල එකතුව $\{(3+4+5)-(6+7)\}-(8+9)$	-
(11)	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2021 වර්ෂය සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 31 දිනෙන් පසුව කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර වලට අදාළ හිමිකම්පෑම් වල එකතුව	-
(12)	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2021 දෙසැම්බර් 31 දිනෙන් පසුව ලැබුණු ප්‍රතිපූරණ වල එකතුව	-
(13)	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කරන ලද දිනට ලැබීමට නියමිතව ඇති ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර වලට අදාළ හිමිකම්පෑම් වල එකතුව (10 + 11 – 12)	-

ප්‍රධාන ගණකාධිකාරී
නම :ඩබ්.එම්.ඩී. බණ්ඩාර
දිනය 2022 පෙබරවාරි 28

සටහන-**(vii)**

අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

වියදම් ශීර්ෂ අංකය : 010

වැඩසටහන් අංකය හා නාමය : 1 මෙහෙයුම් වැඩසටහන්

දිනය	වවුචර් අංකය	ආදායකයාගේ නම	ගෙවීමේ ස්වභාවය	ගණන (රු)
-	-	-	-	-

ප්‍රධාන ගණකාධිකාරී
නම :ඩබ්.එම්.ඩී. බණ්ඩාර
දිනය 2022 පෙබරවාරි 28

2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස් වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2020.12.31 දිනට තත්ත්ව වාර්තාව

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
වියදම් ශීර්ෂ අංකය : 010

අනු අංකය	බැංකුවේ නම	ගිණුම් අංකය	2021.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.)	2021.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය (රු.)	2021.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්)	අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය
1	ලංකා බැංකුව, ටොරින්ටන් ශාඛාව	7040057	**16,589,871.85**	-	-	දෙසැම්බර්

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමි.

ප්‍රධාන ගණකාධිකාරී
නම :ඩබ්.එම්.ඩී. බණ්ඩාර
දිනය 2022 පෙබරවාරි 28

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

ආදායම් ගණන් දීමේ නිලධාරි :අධ්‍යක්ෂ ජනරාල් | වියදම් ශීර්ෂ අංකය :010 | රු.

ආදායම් සංකේතය	ආදායම් විස්තරය	ආදායම් ඇස්තමේන්තුව (1)		ආදායම් රැස්කිරීම් (2)			(3)	ආදායමෙන් ආපසු ගෙවීම් (4)			(5)
		මූලික ඇස්තමේන්තුව 1(i)	සංශෝධිත ඇස්තමේන්තුව 1(ii)	අදාළ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් රැස්කිරීම 2(i)	වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් රැස්කිරීම (SA-21) 2(ii)	එකතුව 2(iii)=2(i)+2(ii)	හිඟ ආදායම් රැස්කිරීම (3)	මුදලින් 4(i)	වැරදි නිවැරදි කිරීම 4(ii)	එකතුව 4(iii)=4(i)+ 4(ii)	ශුද්ධ ආදායම 5=2(iii)+(3)-4(iii)
සටහන - 1	**ආදායම් බද්ද**										
සටහන - 2	**දේශීය භාණ්ඩ හා සේවා මත බද්ද**										
සටහන - 3	**ජාත්‍යන්තර වෙළඳාම මත බදු ආදායම**										
සටහන - 4	**බදු නොවන ආදායම**										
2002.01.00	**කුලී**										
2002.01.01	රජයේ ගොඩනැගිලි කුලී	-	132,166.66	132,166.66		132,166.66					132,166.66
2002.02.00	**පොළිය**										
2002.02.99	වෙනත්	1,000,000.00	1,148,919.21	1,148,919.21		1,148,919.21					1,148,919.21
2003.02.00	**පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම්**										
2003.02.99	විවිධ	350,000.00	135,254.59	135,254.59		135,254.59					135,254.59
2003.99.00	**අනෙකුත් ලැබීම්**	100,000.00	158,270.00	158,270.00		158,270.00					158,270.00
2004.01.00	**සමාජ සංරක්ෂණ දායක මුදල්**										
2004.01.00	මධ්‍යම රජය	6,880,000.00	6,956,249.54	6,956,249.54		6,956,249.54					6,956,249.54
2006.02.00	**ප්‍රාග්ධන වත්කම් විකිණීම**										
2006.02.02	**වෙනත්**		191,960.00	191,960.00		191,960.00					191,960.00
	අනෙකුත් ප්‍රභවයන්ගෙන් ලද ආදායම (ආ)										
	මුළු බදු නොවන ආදායම (අ) + (ආ)	8,330,000.00	8,722,820.00	8,722,820.00	-	8,722,820.00	-	-	-	-	8,722,820.00
	මුළු ආදායම (සටහන් 1 - 4)	8,330,000.00	8,722,820.00	8,722,820.00	-	8,722,820.00	-	-	-	-	8,722,820.00

ප්‍රධාන ගණකාධිකාරී
නම :ඩබ්.එම්.ඩී. බණ්ඩාර
දිනය 2022 පෙබරවාරි 28

ප්‍රධාන ගණන් දීමේ නිළධාරී
නම : ඩබ්.කේ.ඩී. විජේරත්න
තනතුර : අධ්‍යක්ෂ ජනරාල්

ඒසීඒ - 1(i)

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශය

ආදායම් ගණන් දීමේ නිලධාරි : අධ්‍යක්ෂ ජනරාල් **වියදම් ශීර්ෂ අංකය 010**

පූර්ව මුදල් වර්ෂ 03 සඳහා ශුද්ධ ආදායම් රැස්කිරීම	වර්ෂය 1	(2018)	-
	වර්ෂය 2	(2019)	-
	වර්ෂය 3	(2020)	7,423,181.41

කාල පරිච්ඡේදය	ආදායම් සංකේතය	ආදායම් විස්තරය	වර්ෂ ආරම්භක ශේෂය (1)	වාර්තා කරනු ලබන වර්ෂයට අදාළ හිඟ මුදල් (2)	අයකර ගැනීම් (3)	කපා හරින ලද හිඟ ආදායම් (4)	රු. වර්ෂ අවසාන ශේෂය 5=(1)+(2)-[(3)+(4)]
(1) වාර්තා කරනු ලබන වසරට අදාළ හිඟ මුදල්	*උදා:* 1001.01.00 1001.04.00 1002.05.04		-	-	-	-	-
උප එකතුව							
(2) පසුගිය වසරට අදාළ හිඟ මුදල්	*උදා:* 1001.01.00 1001.04.00 1002.05.04		-	-	-	-	-
උප එකතුව							
(3) පසුගිය වසරට පෙර වසර වන විට හිඟ මුදල්	*උදා:* 1001.01.00 1001.04.00 1002.05.04		-	-	-	-	-
උප එකතුව							
එකතුව			-	-	-	-	-

ප්‍රධාන ගණකාධිකාරී
නම :ඩබ්.එම්.ඩී. බණ්ඩාර
දිනය 2022 පෙබරවාරි 28

ප්‍රධාන ගණන් දීමේ නිළධාරී
නම : ඩබ්.කේ.ඩී. විජේරත්න
තනතුර : අධ්‍යක්ෂ ජනරාල්

ඒසීඒ - 1(ii)

මූලික ආදායම් ඇස්තමේන්තුව සහ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අතර විචලතා පැහැදිලි කිරීම

ආදායම් ගණන් දීමේ නිලධාරි :අධ්‍යක්ෂ ජනරාල් **වියදම් ශීර්ෂ අංකය :010**

රු.

ආදායම් සංකේතය	විස්තරය	මූලික ආදායම් ඇස්තමේන්තුව	සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව	වෙනස මූලික ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස	වෙනස්කම්වලට හේතු
2002.01.01	රජයේ ගොඩනැගිලි කුලී	-	132,166.66	100	නිල නිවාසය ආපසු භාර ගැනීම සිදු කරන ලද්දේ මැයි මාසයේදීය.
2002.02.99	පොළිය(වෙනත්)	1,000,000.00	1,148,919.21	15	වර්ෂය තුල වැඩිපුර ණය ලබා දීම
2003.02.99	පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම්(විවිධ)	350,000.00	135,254.59	(61)	ආදායම් අයිතම නිශ්චිත නොවීම
2003.99.00	අනෙකුත් ලැබීම්	100,000.00	158,270.00	58	අබලි භාණ්ඩ වෙන්දේසි ආදායම වැඩි වීම
2004.01.00	මධ්‍යම රජය(සමාජ සංරක්ෂණ දායක මුදල්)	6,880,000.00	6,956,249.54	1	නව නිලධාරීන් බඳවා ගැනීම
2006.02.02	ප්‍රාග්ධන වත්කම් විකිණීම(වෙනත්)	-	191,960.00	100	නිශ්චිතව ඇස්තමේන්තු කළ නොහැකි වීම

ප්‍රධාන ගණකාධිකාරී
නම :ඩබ්.එම්.ඩී. බණ්ඩාර
දිනය 2022 පෙබරවාරි 28

ප්‍රධාන ගණන් දීමේ නිළධාරී
නම : ඩබ්.කේ.ඩී. විජේරත්න
තනතුර : අධ්‍යක්ෂ ජනරාල්

ඒසීඒ - 1(iii)

සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව සහ සත්‍ය ආදායම අතර විචලතා පැහැදිලි කිරීම

ආදායම් ගණන් දීමේ නිලධාරි :අධ්‍යක්ෂ ජනරාල් **වියදම් ශීර්ෂ අංකය :010**

ආදායම් සංකේතය	විස්තරය	සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව	සත්‍ය ආදායම	සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව හා සත්‍ය ආදායම අතර වෙනස	වෙනස සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස	වෙනස්කම්වලට හේතු
2002.01.01	රජයේ ගොඩනැගිලි කුලී	132,166.66	132,166.66	-	0	
2002.02.99	වෙනත්	1,148,919.21	1,148,919.21	-	0	
2003.02.99	විවිධ	135,254.59	135,254.59	-	0	
2003.99.00	අනෙකුත් ලැබීම්	158,270.00	158,270.00	-	0	
2004.01.00	මධ්‍යම රජය(සමාජ සංරක්ෂණ දායක මුදල්)	6,956,249.54	6,956,249.54	-	0	
2006.02.02	ප්‍රාග්ධන වත්කම් විකිණීම(වෙනත්)	191,960.00	191,960.00	-	0	

ප්‍රධාන ගණකාධිකාරී
නම :ඩබ්.එම්.ඩී. බණ්ඩාර
දිනය 2022 පෙබරවාරි 28

ප්‍රධාන ගණන් දීමේ නිළධාරී
නම : ඩබ්.කේ.ඩී. විජේරත්න
තනතුර : අධ්‍යක්ෂ ජනරාල්

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ඒසිඒ -2

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

වියදම් ශීර්ෂ අංකය :010

වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය	වියදමෙහි නම	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරු කිරීම් (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුළු වියදම (5)	ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම්) (6)=(4)-(5) (රු.)
වැඩසටහන (1)	(1) පුනරාවර්තන	673,240,000.00			673,240,000.00	510,893,791.05	162,346,208.95
	(2) ප්‍රාග්ධන	35,000,000.00			35,000,000.00	21,849,162.65	13,150,837.35
	උප එකතුව	708,240,000.00			708,240,000.00	532,742,953.70	175,497,046.30
වැඩසටහන (2)	(1) පුනරාවර්තන						
	(2) ප්‍රාග්ධන						
	උප එකතුව						
	මුළු එකතුව	708,240,000.00			708,240,000.00	532,742,953.70	175,497,046.30

ප්‍රධාන ගණකාධිකාරී
නම :ඩබ්.එම්.ඩී. බණ්ඩාර
දිනය 2022 පෙබරවාරි 28

3.7. මු.රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනය		තථ්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදනය, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
		මුල් ප්‍රතිපාදනය	අවසන් ප්‍රතිපාදනය		
-	-	-	-	-	-
-	-	-	-	-	-
-	-	-	-	-	-
-	-	-	-	-	-

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

ඒසිඒ-6

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

ජංගම නොවන වත්කම්					2021.01.01 දිනට ශේෂය	අත්පත් කරගැනීම්	ශුද්ධ අගය	2021.12.31 දිනට ශේෂය
ස්ථාවර වත්කම්	**611**				**448,726,553.01**	**18,213,507.13**	**37,444,380.13**	**486,170,933.14**
ගොඩනැගිලි සහ ඉදිකිරීම්		**6111**			**157,531,791.65**			**177,862,552.58**
නිවාස			**61111**					
				උප එකතුව				
නිවාස නොවන ගොඩනැගිලි			**61112**		**157,531,791.65**	20,330,760.93	20,330,760.93	177,862,552.58
කාර්යාල ගොඩනැගිලි				6111201	157,531,791.65	20,330,760.93	20,330,760.93	177,862,552.58
				උප එකතුව		20,330,760.93	20,330,760.93	177,862,552.58
වෙනත් ඉදිකිරීම්			**61113**					
				උප එකතුව				
යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ		**6112**			**291,194,761.36**	**18,213,507.13**	**17,113,619.20**	**308,308,380.56**
ප්‍රවාහන උපකරණ			**61121**		**192,821,699.00**			**192,821,699.00**
මගී වාහන				6112101	189,270,200.00			189,270,200.00
යතුරු පැදි				6112109	3,551,499.00			3,551,499.00
				උප එකතුව	192,821,699			192,821,699
වෙනත් යන්ත්‍ර හා උපකරණ			**61122**		**98,373,062.36**	**18,213,507.13**	**17,113,619.20**	**115,486,681.56**
කාර්යාලීය උපකරණ				6112201	3,037,718.15	502,940.91	453,948.41	3,491,666.56
පරිගණක උපකරණ				6112202	42,127,076.20	14,396,475.00	14,172,535.00	56,299,611.20
විද්‍යුත් උපකරණ				6112203	17,582,084.62	1,758,611.22	1,586,814.81	19,168,899.43
සන්නිවේදන උපකරණ				6112204	6,311,614.66	677,608.00	498,468.00	6,810,082.66
ගෘහභාණ්ඩ				6112205	28,556,809.22	806,250.00	345,080.98	28,901,890.20
වෛද්‍ය උපකරණ				6112207	62,800.00	12,000.00	12,000.00	74,800.00
ඉදිකිරීම් උපකරණ				6112213	676,559.51	59,622.00	44,772.00	721,331.51
ආරක්ෂක උපකරණ				6112215	18,400.00			18,400.00
				උප එකතුව	98,373,062.36	18,213,507.13	17,113,619.20	

ජංගම නොවන වත්කම්	කේතය		2021.01.01 දිනට ශේෂය	අත්පත් කරගැනීම්	ශුද්ධ අගය	2021.12.31 දිනට ශේෂය
නැවත නැවත ජනනය නොවන වත්කම්	**614**		**1,075,750,000.00**			**1,075,750,000.00**
ඉඩම්	**6141**		**1,075,750,000.00**			**1,075,750,000.00**
නාගරික හෝ ගොඩනගන ලද ඉඩම්	**61411**		**1,075,750,000.00**			**1,075,750,000.00**
වෙළඳ හා සේවා		6141101	1,075,750,000.00			1,075,750,000.00
		උප එකතුව	**1,075,750,000.00**			**1,075,750,000.00**
			1,524,476,553.01			**1,561,920,933.14**

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PIC/B/CIABC/2/21/25 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022 මැයිදිනි.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
26 MAY 2022
★ ලිපිය අංකය ★

අධ්‍යක්ෂ ජනරාල්,

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Pelhawa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1:6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සුදුසුදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සුදුසුදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ සහතිකවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙදී එය සැම විටම ප්‍රමාණාත්මක

සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ආ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

වටිනාකම රු.28,975,000 ක්වූ වාහන 05 ක් අයිතිය පවරා ගැනීමකින් තොරව 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධනීත කර තිබුණි.

1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

සමාලෝචිත වර්ෂයේ වෙනත් වැය ශීර්ෂයන් වෙතුවෙන් දරන ලද රු.332,640 ක්වූ වියදම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම් යටතේ දක්වා නොතිබුණු අතර පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් යටතේ දක්වා තිබුණි.

1.6.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

වටිනාකම රු.410,150 ක් වූ වාහන අනතුරු සිදුවීම් 05කට සම්බන්ධයෙන් පාඩු හා හානි වලට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

කොමිෂන් සභාව විසින් සකස් කර ඇති වාහන අනතුරු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අල්ලස් වැටලීම්වල -අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් ගිණුම

2020 දෙසැම්බර් 31 දිනට රු.998,330 ක අත්තිකාරම් සම්බන්ධයෙන් නඩු තීන්දු ප්‍රකාශයට පත් කර තිබුණද විගණින දිනය වන 2022 අප්‍රේල් 05 දිනට වසරකට අධික කාලයක් ගතව තිබුණත් එම අත්තිකාරම්, සරප් වෙත නිරවුල් කර නොතිබුණි.

2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය	සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කළ කාර්යසාධන වාර්තාවේ කොටුම්පත මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, කොමිෂන් සභාව විසින් එම වාර්තාව දින 51 ක් ප්‍රමාදව ඉදිරිපත් කර තිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි	
(i) මූදල් රෙගුලාසි 115	ඉකුත් වර්ෂයේ සිදු කළ අධ්‍යන් පැරණි ගබඩා කාමරය කඩා ඉවත් කිරීමේ ප්‍රසම්පාදන කාර්යය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත රු.232,157 ක් ගෙවා තිබුණි.
(ii) මූදල් රෙගුලාසි 137(2) හා (3)	පැරණි ගබඩා කාමරය කඩා ඉවත් කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් විස්තරාත්මක ඇස්තමේන්තුවක් ලබා දී නොතිබුණු අතර රු.237,400 ක්වූ ගෙවීම් සිදු කිරීමේදී බිල් පත් ප්‍රමාණපත් සමඟ සැසඳීමෙන් තොරව ගෙවීම් වවුචර් අනුමත කර තිබුණි.
(iii) මූදල් රෙගුලාසි 371(2) හා 371(5)	අවස්ථා 06 කදී ලබාදී තිබුණු එකතුව රු.44,000 ක්වූ තක්කාර්යය අතුරු අග්‍රිම ප්‍රමාද කර පියවා නිබුණි.

(ඇ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය

(i) 3.1.5 ඡේදය	සෑම මුදල් වර්ෂයකම පෙබරවාරි 26 දිනට පෙර පොදු 47 වාර්තාව අනුව විභාග කළ යුතු. අලුත්වැඩියා කළ යුතු.විකිණිය යුතු හා වෙනත් රජයේ ආයතනවලට පැවරිය හැකි භාණ්ඩ සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කර මාර්තු 17 දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ මාර්තු 30 දින භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.
(ii) 3.1.6 ඡේදය	මාර්තු 17 දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2020 වර්ෂයේ නඳුන් භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මාස 04 ක ප්‍රමාදයක් සහිතව විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

(අ) 2021 වර්ෂයේ වැටලීම් 57 ක් සිදු කර තිබුණු අතර අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා රු.7,130,000 ක් අත්කිකාරම් ලෙස ලබාදී තිබුණි.එම ලබාදී තිබුණු මුළු අත්තිකාරම් වලින් සියයට 22.4 ක් එනම් රු.1,600,000 ක් වැටලීම 30 කට අදාලව ලබාදී තිබුණු අතර එම වැටලීම් සියල්ලම සාර්ථක වී තිබුණි. ඉතිරි සියයට 77.6 ක් එනම් රු.5,530,000 ක් වැටලීම් 27 කට අදාලව ලබාදී තිබුණු අතර එම වැටලීම් සියල්ලම අසාර්ථක වී තිබුණි.

(ආ) කොමිෂන් සභාව විගණනය වෙත ලබාදුන් තොරතුරු අනුව කොමිෂන් සභාව විසින් පවරන ලද නඩුවලින් 2019 හා 2020 වර්ෂවලදී නඩු 10 ක් විවිධ හේතු මත ඉල්ලා අස්කරගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී නඩු 39 ක් ඉල්ලා අස්කරගෙන තිබුණි. එම නඩු 39 න් 2015 වර්ෂයට පෙර පවරන ලද නඩු 5 ක් වූ අතර 2019 වර්ෂයේදී පවරන ලද නඩු 2 ක් විය. ඉතිරි නඩු 32, 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා පැවරූ නඩු විය.

3.2 ප්‍රසම්පාදනයන්

(අ) ආරක්ෂක කාර්පස සඳහා විදුලි සැපයුම් පද්ධතිය සකස් කිරීම

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) ඡේදය ප්‍රකාරව රු.250,000 ඉක්මවන වැඩ කොන්ත්‍රාත් සඳහා වූ යම් කොන්ත්‍රාත්තුවක් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම සිදු කළ යුතු වුවත්, රු.1,903,348 කට ප්‍රදානය කර තිබුණු මෙම කොන්ත්‍රාත්තුවට අදාලව කිසිදු ගිවිසුමක් අත්සන් කර නොතිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 (අ) ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත්කරුවෙකුට කරන ගෙවීම්වලින් නිශ්චිත මුදලක් රඳවා තබා ගත යුතු වුවත් මෙම කොන්ත්‍රාත්තුවට අදාලව එලෙස කටයුතු කර නොතිබුණි.

(iii) මෙම කොන්ත්‍රාත්තුවට අදාලව ප්‍රසම්පාදන කාර්යය ආරම්භයේ සිට නිසි සැලසුමකින් තොරව ක්‍රියා කිරීම් හේතුවෙන් අවස්ථා 02 කදී මිල ගණන් කැඳවීම, නැවත ගොඩනැගිලි දෙපාර්තමේන්තුව භරහා අදාල කාර්යය සිදු කිරීම, ප්‍රධාන කණුවල විදුලි පහන් නිර්මාණය හා කුඩා කණු සඳහා මිල ගණන් කැඳවීම ආදී කටයුතු වරින් වර සිදු කර තිබුණි.

(iv) මෙම ප්‍රසම්පාදන කාර්යය සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත 2021 දෙසැම්බර් 16 දින රු.1,903,348 ක් ගෙවා තිබුණු අතර එහි කළ වැඩවල වටිනාකම සියයට 80 ක් බව සඳහන්ව තිබුණි. විගණන දිනය වන2022 අප්‍රේල් 08 දින වන විටත් ඉතිරි කාර්යයන් නිම කර නොතිබුණි.

(ආ) නව ගබඩා කාමරයක් සකස් කිරීම

(i) මෙම කොන්ත්‍රාත්තුව සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.156,353 ක් ගෙවා තිබුණද ඒ සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් විස්තරාත්මක බිල්පතක් නොතිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 8.9.1(ආ) ඡේදය ප්‍රකාරව රු.250,000 ඉක්මවන වැඩ කොන්ත්‍රාත් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම සිදු කළ යුතු වුවත්, රු.614,200 ක්වූ මෙම කොන්ත්‍රාත්තුවට අදාලව කිසිදු ගිවිසුමක් අත්සන් කර නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

කොමිෂන් සභාව විසින් 2014 වර්ෂයේ මිලදී කල්බදු පදනම යටතේ ලබා ගත් වාහන 06 ක කල්බදු කාලය අවසන්වී වසරක් පමණ ගතවී තිබුණද එම වාහන පවරාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

3.4 පාඩු හා හානි

(අ) 2017 වර්ෂයේ සිට2019 වර්ෂය දක්වා කාල සීමාව තුල සිදු වූ වටිනාකම රු.274,612ක්වූ වාහන අනතුරු 11කට අදාල පාඩු හා අත්නැරීම් සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 31 දින වන විටත් මුදල් රෙගුලාසි විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) කොමිෂන් සභාවට අයත් වාහනයකට සිදු වූ රු.8,965 ක්වූ අලාභය කපාහැරීමට කටයුතුකර ඇති බව විගණනයට ඉදිරිපත් කළ උපලේඛණය මඟින් දක්වා තිබුණද, මූල්‍ය ප්‍රකාශනයේ පාඩු හා හානි ලේඛණයේ තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු ලෙස දක්වා නිබුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

(අ) 2016 මාර්තු 01 දින අග්‍රාමාත්‍ය කාර්යාලයේ පැවති ආර්ථික කළමනාකරණ කැබිනට් කමිටුව මඟින් මලලසේකර මාවතේ, අංක 36/69 සී දරන භූමිය අල්ලස් හෝ දූෂණ වෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පවරා දීමට තීරණය වී නිබූ නමුත් එම භූමියේ

නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමට 2021 මාර්තු 31දින වන විටත් නොහැකි වී තිබුණි.

(ඇ) අධිකරණමය කටයුතුවලින් පසු නඩු තීන්දුව ලැබීමෙන් අනතුරුව හෝ අභියාචනා අවසන් වීමෙන් අනතුරුව එම ගොනුවලට අදාලව පවතින නඩු භාණ්ඩ, නඩු භාණ්ඩ ශේෂයෙන් ඉවත් කළ යුතු වුවත් නඩු තීන්දු ලබාදී වර්ෂ ගණනාවක් ගතවූ නඩුවලට අදාල නඩු භාණ්ඩ අයිතම 05 ක් නඩු භාණ්ඩ නිලධාරියා භාරයේ පැවතුනි.

4. මානව සම්පත් කළමනාකරණය

කොමිෂන් සභාවේ සිවිල් කාර්ය මණ්ඩල තොරතුරු අනුව 2021 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 32 ක්ද, තෘතීය මට්ටමේ පුරප්පාඩු 212 ක්ද, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 117 ක්ද හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 50 ක් පැවතුණි. විමර්ශණ කාර්ය මණ්ඩල තොරතුරු අනුව එම කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 15 ක් පැවතුණි.

එම්.සෝමතිලක

එම්. සෝමතිලක
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

නියෝජ්‍ය විගණකාධිපතිතුමිය

විගණකාධිපති වෙනුවට

සිව්වන පරිච්ඡේදය

4. කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

4. කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අනු අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුම	තත්‍ය නිමැවුම	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
				100% - 90%	75% - 89%	50% - 74%
1	ලද පැමිණිලි සංඛ්‍යාව	3,500	2,335			✓
2	සිදුකළ සාර්ථක අල්ලස් වැටලීම් සංඛ්‍යාව	40	33		✓	
3	අවසන් කල විමර්ශන ගොනු සංඛ්‍යාව	3,000	2,464		✓	
4	අධිකරණවල පවරන නඩු සංඛ්‍යාව	75	62		✓	
5	අධිකරණ වල අවසන් කරන ලද නඩු සංඛ්‍යාව	75	69	✓		
6	පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව	125	25	50ට% අඩු ප්‍රගතියක් ඇත		
7	පුහුණුව ලද කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව	500	302			✓
8	පවත්වන ලද කොමිෂන් සභා රැස්වීම් සංඛ්‍යාව	12	11	✓		
9	පවත්වන ලද විගණන කළමනාකරණ කමිටු රැස්වීම් සංඛ්‍යාව	04	02			✓
10	දරන ලද පුනරාවර්තන වියදම්	673,240,000.00	510,893,791.05		✓	
11	දරන ලද ප්‍රාග්ධන වියදම්	35,000,000.00	21,849,162.65			✓

සටහන:

පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ 2021 වර්ෂයේ අපේක්ෂිත ප්‍රගතිය ලබාගැනීමට නොහැකි විය.

පස්වන පරිච්ඡේදය

5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

තිරසර සංවර්ධන අරමුණු ප්‍රකාශයේ අංක: 16.5 යටතේ දක්වා ඇති පරිදි ''සෑම අංශයකම අල්ලස හා දූෂණය කැපී පෙනෙන ලෙස අඩු කිරීම'' සඳහා කටයුතු කිරීම.

අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0%-49%	50%-74%	75%-100%
රාජ්‍ය සේවයේ සෑම අංශයකම අල්ලස හා දූෂණය කැපී පෙනෙන ලෙස අඩු කිරීම	අල්ලස හා දූෂණ නිවාරණය පිළිබඳ ජනතාවගේ දැනුවත්භාවය වැඩි කිරීම තුලින් අල්ලසට හා දූෂණයට එරෙහි ප්‍රජා දායකත්වය වැඩි කර ගැනීම • වර්ෂයකට දැනුවත් කිරීමේ වැඩසටහන් 125 ක් පැවැත්වීම	• ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් 25ක් පැවැත්වීම	✓		
	දූෂණයට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන ආයතනයක් වන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව තව දුරටත් ශක්තිමත් කිරීම •නීති නිළධාරීන්,විමර්ශන නිළධාරීන් හා දූෂණ නිවාරණ නිළධාරීන් ඇතුළු සෙසු නිළධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම •අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ප්‍රාග්ධන වියදම් ලෙස රු. 35,000,000ක් වෙන් කිරීම	• නීති සහකාර නිළධාරීන් හා දූෂණ නිවාරණ නිළධාරීන් 32 දෙනෙකු සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන් දෙකක් පැවැත්වීම • නීති නිළධාරීන්, නීති සහකාර නිළධාරීන් හා විමර්ශන නිළධාරීන් 70 දෙනෙකු සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම • සෙසු නිළධාරීන් 200 දෙනෙකු සඳහා පුහුණු අවස්ථා ලබා දීම • පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ප්‍රාග්ධන වියදම් ලෙස රු.21,849,162ක මුදලක් වැය කිරීම	✓	✓	

අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0%-49%	50%-74%	75%-100%
රාජ්‍ය සේවයේ සෑම අංශයකම අල්ලස හා දූෂණය කැපී පෙනෙන ලෙස අඩු කිරීම	අල්ලසට හා දූෂණයට එරෙහි අධිකරණ කටයුතු සඳහා යොදා ගන්නා නීති ප්‍රතිපත්ති සංශෝධනය කිරීම • 2021 හා 2022 වර්ෂ වලදී අල්ලස් පනත, වත්කම් බැරකම් පනත හා කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම හා එම පනත් ඒකාබද්ධ කර නව සංගෘහිත පනතක් සකස් කිරීම	පනත සංශෝධනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීම		✓	

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින්

<u>ජයග්‍රහණ</u>

- දූෂණ නිවාරණ වැඩසටහන් සංවිධානය කර පැවැත්වීම සඳහා දූෂණ නිවාරණ නිළධාරීන් 18 දෙනෙකු බඳවා ගැනීම
- නීති නිළධාරීන්ගේ රාජකාරි පහසු කර ගැනීම සඳහා නීති සහකාරවරුන් 18 දෙනෙකු බඳවා ගැනීම
- නීති සහකාර අධ්‍යක්ෂවරුන් 20 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු ආරම්භ කිරීම
- වසර 25 කට වඩා පැරණි අල්ලස් පනත, වත්කම් බැරකම් පනත හා කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමේ කටයුතු ආරම්භ කිරීම
- දෛනිකව ලැබෙන පැමිණිලි අධ්‍යයනය කර නඩු පැවරීමට ප්‍රමාණවත් කරුණු සහිත පැමිණිලි පමණක් විමර්ශනය සඳහා යොමු කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දීම මඟින් විමර්ශන නිළධාරීන්ගේ හා නීති නිළධාරීන්ගේ රාජකාරී කාලය වඩාත් ඵලදායී කර ගැනීමට හැකි වීම
- විමර්ශන කටයුතු කඩිනම් කිරීමට හඳුන්වා දුන් නව ක්‍රමවේදය නිසා 2015ට පෙර ආරම්භ කළ ගොනු වල විමර්ශන අවසන් කර ගැනීමට හැකි වීම

<u>අභියෝග</u>

- දූෂිත නිලධාරීන් පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමට සහ අවශ්‍ය අවස්ථාවල දී සාක්ෂි ලබා දීමට ජනතාව දක්වන සහයෝගය අවම මට්ටමක පැවතීම
- ඉහළ තනතුරු දරණ පුද්ගලයන්ගේ මහා පරිමාණ අල්ලස් හෝ දූෂණ පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමට ව්‍යාපාරිකයින්, ආයෝජකයින් වැනි පාර්ශව ඉදිරිපත් නොවීම
- අල්ලසට හා දූෂණයට එරෙහි වැඩපිළිවෙලක් රාජ්‍ය අංශය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ ඇති උනන්දුව අඩු වීම
- විවිධ විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂඥ දැනුමක් සහිත විශේෂිත විමර්ශන නිලධාරීන් ආයතනය සතු නොවීම.
- දූෂණ නඩු උසාවියේ ඔප්පු කිරීම සඳහා ලේඛන මත පදනම් වූ සාක්ෂි ඉදිරිපත් කළ යුතු වුවත් එවැනි සාක්ෂි සපයා ගැනීම දුෂ්කර වීම
- පැමිණිලි විමර්ශනය කර නඩු පැවරීම මගින් පමණක් අල්ලස හා දූෂණය තුරන් කළ නොහැකි බවත්, ඒ සඳහා අල්ලස හා දූෂණය නිවාරණය පිළිබඳ ජනතාවගේ දැනුවත්භාවය ඉහළ නැංවිය යුතු බවත් බොහෝ පිරිසක් නොදැන සිටීම
- අල්ලස් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයන්ට ප්‍රමාණවත් කාර්යාල ඉඩ පහසුකම් නොමැතිවීම.

හයවන පරිච්ඡේදය

6. මානව සම්පත් පැතිකඩ

6.1.සේවක සංඛ්‍යා කළමනාකරණය

6.2.ආයතනයේ කාර්ය සාධනය උදෙසා
මානව සම්පත් හිඟය හෝ
අතිරික්තය බලපාන ආකාරය

6.3. මානව සම්පත් සංවර්ධනය

6. මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	70	36	34
තෘතීයික	232	35	197
ද්විතියික	442	297	145
ප්‍රාථමික	140	90	50

6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආකාරය

ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් සේවයේ නියුක්ත කිරීම මත සේවකයන්ගේ විෂය පථය අනවශ්‍ය ලෙස පුළුල් වීමක් සිදු නොවන අතර එමඟින් පසු විපරමක් සහිතව කාර්යක්ෂම හා ඵලදායී ආකාරයෙන් කාර්යයන් ඉටු කිරීමට හැකියාවක් පවතී. ඉහළ කාර්ය සාධනයක් අත් කර ගැනීමටද එය ඉවහල් වේ.

එබැවින් මෙම කොමිෂන් සභාවේ පවතින තනතුරු පුරප්පාඩු පහත පරිදි සම්පූර්ණ කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

- 2015 වර්ෂයේදී නව තනතුරු අනුමත කර ගැනීමේදී 2025 වර්ෂය තෙක් වසර දහයක අවශ්‍යතාවය සලකා බලා තනතුර අනුමත කර ගෙන ඇත.
- ඉඩකඩ පහසුකම් සීමිත බැවින් ඉඩ පහසුකම් සපයා ගැනීමට කටයුතු කරමින් පවතින, යෝජිත නව ගොඩනැඟිල්ල ඉදිකිරීමෙන් පසු සියලු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලබයි.
- 2021 වර්ෂය තුල නීති සහකාර නිලධාරීන් 16 දෙනෙකු බඳවා ගෙන ඇත.
- දූෂණ නිවාරණ නිළධාරී තනතුර සඳහා අයදුම්කරුවන් 18 දෙනෙකු 2021.03.01 දින බඳවා ගෙන ඇත.
- සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුර සඳහා නිළධාරීන් 14 දෙනෙකු බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ ලේඛණ අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ ආරක්ෂණ නිෂ්කාශන වාර්තා කැඳවා ඇත.
- පුරප්පාඩුව පැවති නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 02 හා සහකාර අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 02 සඳහා සුදුසු නිළධාරීන් බඳවා ගෙන ඇත.

6.3. මානව සම්පත් සංවර්ධනය

දේශීය පුහුණු පාඨමාලා

ක්‍රම සංඛ්‍යාව	පුහුණු වැඩමුළුව පැවැත් වූ ආයතනය	පුහුණු වැඩමුළුවේ නම	සහභාගි වූ නිලධාරීන්ගේ නම සහ තනතුරු	කාලසීමාව	වියදම
1.	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව	සේවාරම්භක පුහුණුව	නීති සහකාර නිලධාරීන් හා නිවාරණ නිලධාරීන් 32 දෙනෙකු	2021.03.05 . දින සිට 2021.03.19 දින දක්වා	
2.	කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලය	සේවාරම්භක පුහුණුව (නේවාසික)	නීති සහකාර නිලධාරීන් හා නිවාරණ නිලධාරීන් 32 දෙනෙකු	2021.03.22 දින සිට 2021.03.25 දින දක්වා	
3.	හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය	භාෂා පරිවර්තනය පිළිබඳ පුහුණු වැඩසටහන	පී. එම්. රාජකරුණා මිය භාෂා පරිවර්තක	2021.03.22 දින සිට 2021.03.26 දින දක්වා	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය
4.	මිලෝදා ආයතනය	Presentation Techniques & Public Speaking Skills	නිවාරණ නිළධාරීන් 18 දෙනෙකු	2021.06.10 දින සිට 2021.10.11 දින දක්වා	රුපියල් 180,000.00
5.	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව	ඵලදායීතා පුහුණු වැඩමුළුව	කාර්යාල කාර්ය සහායක සේවයේ 21 දෙනෙකු	2021.12.20 දින පෙ.ව. 9.00 සිට පෙ.ව. 12.00 දක්වා	රුපියල් 24,604.00
6.	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව	ඵලදායීතා පුහුණු වැඩමුළුව	කාර්යාල කාර්ය සහායක සේවයේ 22 දෙනෙකු	2021.12.20 දින ප.ව. 1.00 සිට ප.ව. 4.00 දක්වා	
7.	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව	ඵලදායීතා පුහුණු වැඩමුළුව	රියදුරු සේවයේ 21 දෙනෙකු	2021.12.22 දින පෙ.ව. 9.00 සිට පෙ.ව. 12.00 දක්වා	රුපියල් 25,128.00
8.	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව	ඵලදායීතා පුහුණු වැඩමුළුව	රියදුරු සේවයේ 21 දෙනෙකු	2021.12.22 දින ප.ව. 1.00 සිට ප.ව. 4.00 දක්වා	

අනු අංකය	පුහුණු වැඩමුළුව පැවැත් වූ ආයතනය	පුහුණු වැඩමුළුවේ නම	සහභාගි වූ නිලධාරීන්ගේ නම සහ තනතුරු	කාලසීමාව	වියදම
9.	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව	එක් දින පුහුණු පාඨමාලාව	නීති නිලධාරීන්, නීති සහකාර නිලධාරීන් සහ විමර්ශන නිලධාරීන් 70 දෙනෙකු	2021.12.23	
10.	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව	ඵලදායීතා පුහුණු වැඩමුළුව	භාෂා පරිවර්තක, සංවර්ධන නිළධාරී, කළමණාකරණ සේවා නිළධාරී, තොරතුරු තාක්ෂණ සේවයේ නිළධාරීන්, යතුරු ලේඛක නිලධාරීන් 20 දෙනෙකු	2021.12.27 දින පෙ.ව. 9.00 සිට පෙ.ව. 12.00 දක්වා	රුපියල් 51,096.00
11.	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව	ඵලදායීතා පුහුණු වැඩමුළුව	භාෂා පරිවර්තක, සංවර්ධන නිළධාරී, කළමණාකරණ සේවා නිළධාරී, තොරතුරු තාක්ෂණ සේවයේ නිළධාරීන්, යතුරු ලේඛක නිලධාරීන් 18 දෙනෙකු	2021.12.27 දින ප.ව. 1.00 සිට ප.ව. 4.00 දක්වා	
12.	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව	ඵලදායීතා පුහුණු වැඩමුළුව	භාෂා පරිවර්තක, සංවර්ධන නිළධාරී, කළමණාකරණ සේවා නිළධාරී, තොරතුරු තාක්ෂ සේවයේ නිළධාරීන්, යතුරු ලේඛක නිලධාරීන් 25 දෙනෙකු	2021.12.28 දින පෙ.ව. 9.00 සිට පෙ.ව. 12.00 දක්වා	
13.	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව	ඵලදායීතා පුහුණු වැඩමුළුව	භාෂා පරිවර්තක, සංවර්ධන නිළධාරී, කළමණාකරණ සේවා නිළධාරී, තොරතුරු තාක්ෂ සේවයේ නිළධාරීන්, යතුරු ලේඛක නිලධාරීන් 23 දෙනෙකු	2021.12.28 දින ප.ව. 1.00 සිට ප.ව. 4.00 දක්වා	

විදේශීය පාඨමාලා

අනු අංකය	පුහුණු වැඩමුළුව/ සම්මන්ත්‍රණය පැවැත්වූ රට	පුහුණු වැඩමුළුව/ සම්මන්ත්‍රණයේ නම	සහභාගි වූ නිලධාරීන්ගේ තනතුරු	කාලසීමාව	සමස්ථ ආයෝජනය
01.	මාලදිවයින	Promoting International Cooperation to Counter Corruption and Anti Money Laundering in the Indian Ocean Region	ඩී.අයි.රාජපක්ෂ මිය - ස/අ/ජ එස්.එම්.ඒ.ඒ.පී.කේ. සමන්දපෙරුම මිය ස/අ (නීති) පී.ජී.ආර්.සුමේන්ද්‍ර මයා ස/පොලිස් අධිකාරි එම්.ඒ.ආර්.රණසිංහ මයා ප්‍රධාන පොලිස් පරීක්ෂක	19/10/2021 සිට 21/10/2021 දක්වා	ඇ.ඩොලර් 480
02.	වියානා	First Globe Network Meeting (UNODC) Global Operational Network of Anti-Corruption Law Enforcrment Authorities	කොමසාරිස් III අධ්‍යක්ෂ ජනරාල්	15/11/2021 සිට 17/11/2021 දක්වා	රුපියල් 189,500 ඇ.ඩොලර් 3,930 පවුම් 150
03.	ඊජිප්තුව	Ninth Session of the Conference of the States Parties to the United Nations Convention Against Corruption	කොමසාරිස් III අධ්‍යක්ෂ ජනරාල් එම්.ආර්.වයි.කේ.උඩවෙල මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ඩබ්.එම්.ටී.ඩී.බණ්ඩාර මෙය ස/අ (නීති)	13/12/2021 සිට 17/12/2021 දක්වා	රුපියල් 600,000 ඇ.ඩොලර් 10,990

*** ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න**

පුහුණුව මඟින් දැනුම කුසලතා හා ආකල්ප වර්ධනයත් සමඟ රැකියා අභිප්‍රේරණය වී කාර්ය සාධනය වර්ධනය වේ. ඒ අනුව විවිධ පුහුණු වැඩසටහන් වෙත සේවකයින් යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

හත්වන පරිච්ඡේදය

7. අනුකූලතා වාර්තා

7. අනුකූලතා වාර්තා

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-	මෙවැනි ගිණුම් නොමැත	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-	එම	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම් (වැටලීම් අත්තිකාරම්)	අනුකූල වේ		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩි නඩි ලේඛන /පුද්ගල පඩි නඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා හේතු පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරීක්ෂණ ක්‍රියාමාර්ග
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ,අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	ඇතැම් අංශ වලින් පමණක් පිළිතුරු සපයා ඇත	

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා හේතු පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරීක්ෂණ ක්‍රියාමාර්ග
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	ගෝලීය Covid 19 වසංගතය නිසා ක.වි. දෙපාර්තමේන්තුවෙන් එවන ලද DMA/AMC/M/2020/5-4 ලිපියෙන් කමිටු රැස්වීම් 4ක් පැවැත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇත.ඒ අනුව 2021 වර්ෂය සඳහා කමිටු රැස්වීම් 02ක් පමණක් පවත්වන ලදි	
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා හේතු පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය කිරණ ක්‍රියාමාර්ග
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	විගණකාධිපති වෙත යැවීමට කටයුතු කර ඇත		
9.2	වාහන ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම		සියලු වාහන ධාවන තත්වයේ පවතී	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	සෑම අනතුරක් සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලැබේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම		කොවිඩ් වසංගත තත්වය මත සිදු කිරීමට නොහැකි වී ඇත	
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	පවරා ගැනීමට කටයුතු කර ඇත		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රඟෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	-	එවැනි ගිණුම් නැත	
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරවකටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර ගැනීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමා නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය කිරණ ක්‍රියාමාර්ග
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූලවීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කිරීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර සිටීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	-	එවැනි ගිණුම් නැත	
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	-	එම	
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	-	එම	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ පවත්වා ගෙන යනු ලබයි		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරීක්ෂණ ක්‍රියාමාර්ග
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	සියළුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී ඇත		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	සියළුම වාර්තා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම.**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත් කාලීන කර පවත්වා ගෙනයාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ්අඩවිය හරහා ලබාදී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ යෝජනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක 05/2008 හා 05/2008(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූල වේ/අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරූණ ක්‍රියාමාර්ග
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛඅංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙක් සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

අවසානය